# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,136 — 1960 මැයි 27 වැනි සිකුරාද — 27.5.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 361 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 373 | ආණ්ඩුවේ තොවන දැන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 377 | රට ඔිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බෑහිරාදිය විකිණීම ... ... | 390 | විවිධ දැන්වීම් ... ... ... | — |


අතිරේකය

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 1959 ජූලි—දෙසැම්බර් දක්වාවූ දෙවන අර්ධ-වාර්ෂික සූචිය

## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් සෑම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එන තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

361—ජේ. ඇන්. බී 23856—6,810 (5/60)

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

සංලක්ෂ්‍යය.—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. අවශ්‍ය සුදුසුකම්.—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. වෙනත් අවශ්‍ය කරුණු.—(1) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ ඇත්තේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## ලංකා යුද්ධ හමුදව—සෙසුනිල පත්වීම්

1. ලංකා යුද්ධ හමුද නිත්‍ය භට සේනාවේ පහත සඳහන් සෙසු නිල පත්වීම් සඳහා යට දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ :—

(අ) බලලත් නිලධාරි 2 ශ්‍රෙණිය (සහකාර පරිමාන මාණක), ලංකා ඉංජිනේරු බලකාය.

(ආ) සාජන්ට් උපදේශක (සාමාන්‍ය අධ්‍යාපනය), ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය.

(ඇ) සාජන්ට් උපදේශක (පරිවර්තන කටයුතු), ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය.

(ඈ) කෝප්පරල් පරිපාලක (ගොඩනැගිලි 2 ශ්‍රෙණිය), ලංකා ඉංජිනේරු බලකාය.

(ඉ) කෝප්පරල් (පරිපාලක විදුලි හා යාන්ත්‍රික 2 ශ්‍රෙණිය), ලංකා ඉංජිනේරු බලකාය.

(ඊ) කෝප්පරල් (ලිපිකරු කාර්මික), ලංකා ඉංජිනේරු බලකාය.

(උ) කෝප්පරල් (ගබඩාකරු කාර්මික), ලංකා ඉංජිනේරු බලකාය.

(ඌ) කෝප්පරල් (වැලි/යාන්ත්‍රික), ලංකා ඉංජිනේරු බලකාය.

(එ) කෝප්පරල් (ලිපිකරු ලඝු ලේඛක), ලංකා යුද්ධ හමුද සේවා බලකාය.

(ඒ) සාමාන්‍ය සෙබළ/සැපර් (පරිපාලක ගොඩනැගිලි 3 ශ්‍රෙණිය), ලංකා ඉංජිනේරු බලකාය.

(ඔ) සාමාන්‍ය සෙබළ/සැපර් (ලිපිකරු කාර්මික සේවාව), ලංකා ඉංජිනේරු බලකාය.

(ඕ) සාමාන්‍ය සෙබළ/සැපර් (ලිපිකරු), ලංකා ඉංජිනේරු බලකාය.

(ක) සාමාන්‍ය සෙබළ/සැපර් (රථවාහන යාන්ත්‍රික කටයුතු පිළිබඳ සේවක), ලංකා ඉංජිනේරු බලකාය.

(ග) සාමාන්‍ය සෙබළ/සැපර් (ගබඩාකරු කාර්මික), ලංකා ඉංජිනේරු බලකාය.

(ජ) සංඥා සෙබළ (" වැලි මිකැනික් "), ලංකා සංඥා බලකාය.

(ට) සාමාන්‍ය සෙබළ (ලිපිකරු), ලංකා යුද්ධ හමුද සේවා බලකාය.

(ඩ) සාමාන්‍ය සෙබළ (ගබඩාකරු " සැපයීමේ කටයුතු "), ලංකා යුද්ධ හමුද සේවා බලකාය.

(න) සාමාන්‍ය සෙබළ (" බුචර් "), ලංකා යුද්ධ හමුද සේවා බලකාය.

(ප) සාමාන්‍ය සෙබළ (අරක්කැමි), ලංකා යුද්ධ හමුද සේවා බලකාය.

(බ) සාමාන්‍ය සෙබළ (රියැදුරු), ලංකා යුද්ධ හමුද සේවා බලකාය.

(ම) සාමාන්‍ය සෙබළ, ලංකා යුද්ධ හමුද වෛද්‍ය බලකාය.

(ය) සාමාන්‍ය සෙබළ (උපකරණ අළුත්වැඩියා කරන්නෝ), ලංකා යුද්ධ හමුද යුද්ධායුධ බලකාය.

(ර) සාමාන්‍ය සෙබළ (පාවහන් " බූට්ස් " අළුත්වැඩියා කරන්නෝ), ලංකා යුද්ධ හමුද යුද්ධායුධ බලකාය.

2. **සාමාන්‍ය කොන්දේසි :**

අයදුම්කරුවකු—

(අ) ලාංකිකයෙක් විය යුතුයි. " ලාංකික " යනුවෙන් අදහස්කරනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියෙකු වූ කෙනෙකි.

(ආ) යමත් වශයෙන් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි 5 වන පන්තිය සමත්ව සිටිය යුතුයි.

(ඇ) උස අඩි 5 යි අඟල් 4 ට නොඅඩු විය යුතුයි.

(ඈ) 1960 ජූලි මස 1 වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩුවද 40 ට නොවැඩිවද සිටිය යුතුයි.

(ඉ) යුද්ධ හමුද ආඥපති තුමාගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුයි.

කෙසේ වෙතත්, යුද්ධ හමුද ආඥපති තුමාගේ අනුමැතිය ඇතිව, විශෙෂ අවස්ථාවලදී අවුරුදු 40 ට වැඩිවන හෝ අඩි 5 යි අඟල් 4 ට අඩුවෙන් උස ඇති හෝ අවුරුදු 40 ට වඩා වයස්වූද, උස අඩි 5 යි අඟල් 4 ට අඩුවූ අය බඳවාගත හැක.

3. මේ තනතුරු සඳහා ඉදිරිපත්වන සේවාමුක්ත භටයෙක් වේ නම්, ඉහත දක්වන ලද 2 ඡෙදයෙහි සඳහන් සුදුසුකම්වලට අමතර වශයෙන්—

(1) තමා ලංකා ආරක්ෂක හමුදව ඇතුළු බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයේ යම් හමුදවක අවුරුද්දකට අඩු නොවන කාලයක් සේවය කර ඇති බවට, හා

(2) යුද්ධ සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී චරිතය " ඉතා හොඳ " යැයි වර්ගකර ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. **විශෙෂ සුදුසුකම් :**

ඉහත සඳහන් ඡෙදයන්හි දක්වනලද සුදු සුකම්වලට අමතර වශයෙන් පහත දක්වෙන තනතුරුවලට ඉදිරිපසින් දක්වා ඇති " විශෙෂ සුදුසුකම් " ඇති අයදුම්කරුවන් කෙරෙහි විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(අ) බලලත් නිලධාරි 2 වන ශ්‍රෙණිය (සහකාර පරිමාන මාණක), ලංකා ඉංජිනේරු බලකාය—

ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන ගොඩනැගිලි පිළිබඳ සම්පූර්ණ සංධ්‍යාකාල පන්තිය (විෂයයන් සියල්ලක්ම) ඇතුළුව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

නැතහොත්—

ගොඩනැගිලි පිළිබඳ සංධ්‍යාකාල පන්තියේ 1 වන සහ 2 වන අවුරුදු කාල සීමාව (විෂයයන් සියල්ලක්ම) ඇතුළුව සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති අතර ගොඩනැගිලිකරුවන්ගේ මිණුම් පිළිබඳ සංධ්‍යාකාල පන්තියේ 1 වන අවුරුද්ද සම්පූර්ණ කර, පරිමාණ මැනීම පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්දක් ඇතිව සිටීම.

(ආ) සාජන්ට් උපදේශක (සාමාන්‍ය අධ්‍යාපනය) ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය

(ඇ) සාජන්ට් උපදේශක (පරිවර්තන කටයුතු), ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය

යටත්වශයෙන් පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් තිබිය යුතුයි :—

(1) සිංහල පුහුණු ගුරු සහතික පත්‍රය ලබා සිටීම.
(2) ඉංග්‍රීසි ජ්‍යොෂ්ඨය සමග සිංහල ගුරු සහතික පත්‍රය ලබා සිටීම.
(3) ඉංග්‍රීසි ජ්‍යොෂ්ඨය හෝ උසස් පාඨශාලා සහතික පත්‍රය සමග සිංහල උසස් පෙළ අධ්‍යයන පොදු සහතික පත්‍රය ලබා සිටීම.
(4) ඉංග්‍රීසි ජ්‍යොෂ්ඨයෙන් හා සිංහල ජ්‍යොෂ්ඨයෙන් සමත්ව සිටීම. යටත් වශයෙන් සම්මාන සාමර්ථ 4 ක් අවශ්‍ය වනු ඇත.

ජ්‍යොෂ්ඨ සහතික පත්‍ර විභාගය සඳහා සිංහලෙන් සාමාන්‍ය විද්‍යාව හා ගණිතය ඉගැන්වීමේ හැකියාවක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

ඉගැන්වීමේ පළපුරුද්ද හා අමතර වශයෙන් ඉගැන්වීමට පිළියෙල කළ දෑ ඇතුළු සෑම සුදුසුකමක්ම විස්තර වශයෙන් සඳහන් කළ යුතුය.

යථෝක්ත සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර ආදියක් ලබා තිබේ නම් ඉදිරිපත් කළ යුතුයි.

ඉහත සඳහන් සුදුසුකම්වලට අමතර වශයෙන් පරිවර්තනය කිරීමේ හා පුවත්පත් වලට ලිපි සැපයීමේ කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති, අධ්‍යාපන උපදේශක (පරිවර්තන කටයුතු) තනතුර සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් කෙරෙහි විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) කෝප්‍රල් (පරිපාලක, " ගොඩනැගිලි " 2 ශ්‍රෙණිය) ලංකා ඉංජිනේරු බලකාය

ඉංග්‍රීසි කණිෂ්ඨය සමත්කර, ලංකා කාර්මික විද්‍යාලයෙහි ගොඩනැගිලි පිළිබඳ සංධ්‍යාකාල පන්තියේ 1 වන අවුරුද්ද සම්පූර්ණකර සිටිය යුතු අතර විශාල ගොඩනැගිලි කර්මාන්තයක අවුරුදු 2 ක වැඩ කිරීමේ පළපුරුද්දක් තිබිය යුතුයි.

නැතහොත්—

ඉංග්‍රීසි කණිෂ්ඨය සමත් කිරීමට අමතර වශයෙන් විශාල ගොඩනැගිලි කර්මාන්තයක යටත්වශයෙන් අවුරුදු 3 ක වැඩ කිරීමේ පළපුරුද්දක් තිබිය යුතුයි.

(ඉ) කෝප්‍රල් (පරිපාලක විදුලි හා යාන්ත්‍රික) 2 ශ්‍රෙණිය, ලංකා ඉංජිනේරු බලකාය

ඉංග්‍රීසි කණිෂ්ඨය සමත්කර සිටිය යුතුය. ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන විදුලි හා යාන්ත්‍රික කර්මාන්තය පිළිබඳ පන්තියේ 1 වන අවුරුද්ද සාර්ථක ලෙස සම්පූර්ණකර සිටිය යුතුය. රජය යටතේ නැතහොත් ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක් යටතේ විදුලි හා යාන්ත්‍රික කර්මාන්තය පිළිබඳ සුළු පරිපාලක තනතුරක අවුරුදු 2 ක් සේවයකර ලබන ලද පළපුරුද්දක් තිබිය යුතුය.

නැතහොත්—

කණිෂ්ඨය දක්වා ලබා ඇති ඉංග්‍රීසි අධ්‍යාපනයට අමතර වශයෙන් රජය යටතේ නැතහොත් ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක් යටතේ විදුලි හා යාන්ත්‍රික කටයුතු පරිපාලනය පිළිබඳ යටත් වශයෙන් අවුරුදු 3 ක පළපුරුද්දක් තිබිය යුතුය.

(ඊ) කෝප්‍රල් (ලිපිකරු කාර්මික) ලංකා ඉංජිනේරු බලකාය...

ඉංග්‍රීසි කණිෂ්ඨය සමත්කර විනාඩියකට වචන 20 ක් ටයිප් ගැසීමේ හැකියාවක් තිබිය යුතුය. ඊට අමතර වශයෙන් ඉංජිනේරු කර්මාන්ත සංවිධානයක, මුදල් අංශයෙහි " කම්කරු " මිළ නියම කිරීම හා වැටුප් ලේඛන සකස් කිරීම පිළිබඳ සෑහෙන දැනීමක් ඇතිව සිටීම හෝ ඉංජිනේරු ගබඩාවක ද්‍රව සැපයීම, ලැජර් පොත්වල වැඩ කිරීම ගැන යටත්වශයෙන් අවුරුදු 2 ක පළපුරුද්දක් තිබිය යුතුය.

(උ) කෝප්‍රල් (ගබඩාකරු කාර්මික) ලංකා ඉංජිනේරු බලකාය

ඉංග්‍රීසි කණිෂ්ඨය සමත්කර විනාඩියකට වචන 15 ක් ටයිප් ගැසීමේ හැකියාවක් තිබිය යුතුයි. ගබඩාකරුවකු වශයෙන් අවුරුදු 2 ක වැඩ කිරීමේ පළපුරුද්දක් තිබිය යුතුයි.

සෑම වර්ගයකම ගොඩනැගිලි තැනීමට ගන්නා ද්‍රව්‍ය හා ඉංජිනේරු ගබඩා පිළිබඳ අමතර සුදුසුකමක් වනු ඇත.

(ඌ) කෝප්‍රල් (වැලි/යාන්ත්‍රික), ලංකා ඉංජිනේරු බලකාය

කලින් ලංකා සංඥ බලකායේ මෙවැනි සේවයක යෙදී සිටියවුන් කෙරෙහි විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(එ) කෝප්‍රල් (ලිපිකරු ලඝු ලේඛක), ලංකා යුද්ධ හමුද සේවා බලකාය

වයස අවුරුදු 25 ට අඩුවිය යුතුයි. ඉංග්‍රීසි අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුයි. වාණිජ විෂයයන් ඇතුළුව සමත්ව සිටීම වඩා හොඳයයි සලකනු ලැබේ.

නැතහොත්—

ඉංග්‍රීසි කණිෂ්ඨය වාණිජ විෂයයන් ඇතුළුව සමත්ව සිටිය යුතුයි.

යටත්වශයෙන් පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් ඇති කාර්‍යක්ෂම ලඝු ලේඛකයෙකු විය යුතුයි :—

(1) විනාඩියකට ඉංග්‍රීසි වචන 80 ක් ලඝු ලේඛනය කිරීමට හා වචන 30–40 දක්වා ඉංග්‍රීසියෙන් ටයිප් ගැසීමට හැකිවීම.
(2) විනාඩියකට සිංහල වචන 60 ක් ලඝු ලේඛනය කිරීමට හා වචන 15–25 දක්වා සිංහලෙන් ටයිප් ගැසීමට හැකිවීම.
(3) කාර්‍යාලයීය වැඩ කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම.

(ඒ) සාමාන්‍ය සෙබළ/සැපර් (පරිපාලක " ගොඩනැගිලි " 3 වන ශ්‍රෙණිය), ලංකා ඉංජිනේරු බලකාය

ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන ගොඩනැගිලි පිළිබඳ සංධ්‍යාකාල පන්තියේ 1 වන අවුරුද්ද සාර්ථක ලෙස සම්පූර්ණකර සිටිය යුතුය.

නැතහොත්—

ගොඩනැගිලි තැනීම පිළිබඳව යටත්වශයෙන් අවුරුදු 2 ක පළපුරුද්දක් තිබිය යුතුය.

| | |
|---|---|
| (ඔ) සාමාන්‍ය සෙබළ/සැපර් (ලිපිකරු කාර්මික), ලංකා ඉංජිනේරු බලකාය | යටත්වශයෙන් ඉංග්‍රීසි කණිෂ්ඨය සමත්ව විනාඩියකට වචන 15–20 ටයිප් ගැසීමෙ හැකියාවක් තිබීම හා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ වෙළඳ සමාගමක අඩු වශයෙන් නොකඩවා අවුරුදු 1 ක් ලිපිකරුවකු වශයෙන් වැඩ කිරීමේ පළපුරුද්දක් ලබා සිටීම.<br>ඉහත සඳහන් සුදුසුකම්වලට අමතර වශයෙන් දක්ෂ ලඝු ලේඛකයෙකු වීම හෝ ඉංජිනේරු ආයතනයක වැඩ කළ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ඕ) සාමාන්‍ය සෙබළ/සැපර් (ලිපිකරු), ලංකා ඉංජිනේරු බලකාය | කණිෂ්ඨය සමත් විය යුතුය (ඉංග්‍රීසි, සිංහල හෝ දෙමල).<br>ලිපිකරුවන් වශයෙන් වැඩ කිරීමේ පළපුරුද්දක් ඇති අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ක) සාමාන්‍ය සෙබළ/සැපර් (රථවාහන යාන්ත්‍රික කටයුතු පිළිබඳ සේවක), ලංකා ඉංජිනේරු බලකාය | 6 වන ප්‍රමාණය සමත් විය යුතුයි (ඉංග්‍රීසි, සිංහල හෝ දෙමල).<br>රථවාහන යාන්ත්‍රික කටයුතු පිළිබඳ සේවකයන් වශයෙන් වැඩකළ පළපුරුද්දක් ඇති අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ග) සාමාන්‍ය සෙබළ/සැපර් (ගබඩාකරු කාර්මික), ලංකා ඉංජිනේරු බලකාය | කණිෂ්ඨය සමත් විය යුතුයි (ඉංග්‍රීසි, සිංහල හෝ දෙමල).<br>ගබඩාකරුවන් වශයෙන් වැඩ කිරීමේ පළපුරුද්දක් ඇති අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ජ) සංඥ සෙබළ ('' වැලි මිකැනික් ''), ලංකා සංඥ බලකාය | ගණිතය හා භෞතික විද්‍යාව ඇතුළුව ජ්‍යෙෂ්ඨය හෝ ඊට සමාන විභාගයකින් සමත් අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.<br>විදුලි පණිවුඩ උපකරණ නඩත්තු කිරීම පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත. |
| (ට) සාමාන්‍ය සෙබළ (ලිපිකරු) ලංකා යුද්ධ හමුදා සේවා බලකාය | ඉංග්‍රීසි කණිෂ්ඨය, සිංහල හෝ දෙමළ විෂයයක් වශයෙන් ගෙන සමත්ව සිටිය යුතුයි.<br>ටයිප් ගැසීමේ දැනීම ඇතිව ලිපිකාර සේවයේ පළපුරුද්දක් ඇති අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.<br>1960 ජූලි මස 1 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු විය යුතුයි. |
| (ඩ) සාමාන්‍ය සෙබළ (ගබඩාකරු '' සැපයීමේ කටයුතු ''), ලංකා යුද්ධ හමුදා සේවා බලකාය | 1960 ජූලි මස 1 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු විය යුතුයි.<br>ඉංග්‍රීසි කණිෂ්ඨය, සිංහල හෝ දෙමළ විෂයයක් වශයෙන් ගෙන සමත්ව සිටිය යුතුයි.<br>ගබඩා හා ගණන් තැබීමේ කටයුතු පිළිබඳ දැනීමක් ඇති අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (න) සාමාන්‍ය සෙබළ ('' බුචර් '') ලංකා යුද්ධ හමුදා සේවා බලකාය | 1960 ජූලි මස 1 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩුවිය යුතුයි.<br>7 වන ප්‍රමාණය සමත්ව සිටිය යුතුයි (ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ).<br>'' බුචර් '' කෙනෙකු වශයෙන් වැඩකළ පළපුරුද්දක් තිබිය යුතුයි. |
| (ප) සාමාන්‍ය සෙබළ (අරක්කැමි), ලංකා යුද්ධ හමුදා සේවා බලකාය | 1960 ජූලි මස 1 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩුවිය යුතුය.<br>7 ප්‍රමාණය සමත්ව සිටිය යුතුය. (ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ)<br>අරක්කැමියෙකු වශයෙන් වැඩකළ පළපුරුද්දක් තිබිය යුතුයි. |
| (බ) සාමාන්‍ය සෙබළ (රියැදුරු), ලංකා යුද්ධ හමුදා සේවා බලකාය | 1960 ජූලි 1 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩුවිය යුතුය.<br>7 ප්‍රමාණය සමත්ව සිටිය යුතුය (ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ).<br>'' ටොන් 3 නෝ '' ලොරි පැදවීමේ හැකියාවක් තිබිය යුතුයි. |
| (ම) සාමාන්‍ය සෙබළ ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය ... | ජ්‍යෙෂ්ඨය සමත්කර ඇති අයට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ය) සාමාන්‍ය සෙබළ (උපකරණ අළුත්වැඩියා කරන්නෝ), ලංකා යුද්ධ හමුදා යුද්ධායුධ බලකාය | 7 ප්‍රමාණය සමත්කර සිටිය යුතුයි (ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ).<br>හම් සහ හන රෙදි පිළිබඳ ලක්ෂණ හා විවිධ වැඩවලට ඒවායින් ඇති ප්‍රයෝජන ගැන දැනීමක් තිබිය යුතුයි.<br>නූල් සෑදීම හා ඒක හා ද්විත්ත මැහීමට හැකියාවක් තිබිය යුතුයි.<br>උපකරණ අළුත්වැඩියා කිරීමට සුදුසු බව වාර්තා කිරීමට හා වැඩ සකස් කොට ද්‍රව්‍ය තෝරා ගැනීමට හැකියාවක් තිබිය යුතුයි.<br>සෑම වර්ගයකම හන රෙදි අළුත්වැඩියා කිරීමට හැකියාවක් තිබීම. උදහරණයක් වශයෙන් දනෙන් පහලට දමන වැස්ම '' ගේටර්ස් ''—පටි '' බෙල්ට්ස් ''—කුඩා මළු '' පවුචර්ස් '' ආදියයි.<br>හම් පටි සෑදීම, අළුත්වැඩියා කිරීම, මහනලද හා නමනලද හම් උපකරණ අළුත් වැඩියා කිරීමට හැකියාවක් තිබිය යුතුයි.<br>මෝටර් රථ වහලවල්වල සුළු අළුත්වැඩියා කිරීම් ආදිය කළ හැකි විය යුතුයි.<br>කඹ ලිහා ප්‍රයෝජනයට ගැනීමට සකස් කළ හැකි විය යුතුයි. |
| (ර) සාමාන්‍ය සෙබළ (පාවහන් '' බූට්ස් '' අළුත්වැඩියා කරන්නෝ) ලංකා යුද්ධ හමුදා යුද්ධායුධ බලකාය | 7 ප්‍රමාණය සමත්කර සිටිය යුතුයි (ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ).<br>මේ වැඩ කළ හැකි විය යුතුයි—<br>පරණ පාවහන් හම ගැලවීම, '' ටෝ ටිප්ස් '', '' ස්ටඩ්ස් '' සහ පිරවූ දෑ ගැලවීම.<br>පාවහන් අඩියට අළුත් හමක් දැමීමට සකස් කිරීම.<br>අළුත් හම් අඩියක් දමා අනවශ්‍ය කොටස කපා හැරීම.<br>'' හීල් ටිප්ස් '', '' හීල් ලිප්ට්ස් '', '' ටෝ ටිප්ස් '' සහ ඇණ සවි කිරීම.<br>පාවහන්වල උඩ කොටස, ඉටිවලින් නූල සකස් කර අළුත්වැඩියා කිරීම.<br>විවිධ කාර්‍යයන් සඳහා වුවමනා ද්‍රව්‍ය තෝරාගැනීම, පාවහන්, '' බූට්ස් ''—පාවහන් පාවිච්චියට නුසුදුසු බව දැනගැනීම. |

5. **සේවා කාලය :**

අවුරුදු 12 ක සේවය සඳහා බඳවාගනු ලබන සොල්දාදුවකු, පළමු අවුරුදු 5 නිත්‍ය බල සේනාවේද, ඉතිරි අවුරුදු 7 නිත්‍ය බල සේවා බල හමුදාවේද, සේවය කිරීමෙන් පසු අස්කරනු ලැබීමට ඉඩ තිබේ. සමහර අවස්ථාවලදී සොල්දාදුවකුට ස්වකීය නිත්‍ය බල හමුදා සේවය අවුරුදු 12 දක්වා දීර්ඝ කරනු ලැබීමක්, අවුරුදු 32 දක්වා එහිම සේවය කිරීමටත් ඉඩ තිබේ.

6. වැටුප් හා අතිරේක දීමනා :

දනට නිත්‍ය බල සේනාවේ " සෙසු නිල " දරණ භටයින් සඳහා ගෙවනු ලබන වැටුප් සහ අතිරේක දීමනාදිය පහත සඳහන් වේ :—

(අ) හමුදුවට බැඳීමේදී 31 දිනක මසකට වැටුප් හා දීමනා—

| | වැටුප් | ජීවනාධාර මුදල | සලාක දීමනා | ලොන්ඩරි දීමනා | විවාහ දීමනා | ශුද්ධ පඩිය |
|---|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| සාමාන්‍ය සෙබළ— | | | | | | |
| අවිවාහක | 46 50 | 27 90 | — | — | — | 74 40 |
| විවාහක | 46 50 | 27 90 | 79 67 | 3 99 | 25 00 | 183 06 |
| ලාන්ස් කෝප්‍රල් ලාන්ස් බොම්බඩියර්— | | | | | | |
| අවිවාහක | 62 00 | 43 40 | — | — | — | 105 40 |
| විවාහක ... | 62 00 | 43 40 | 79 67 | 3 99 | 25 00 | 214 06 |
| කෝප්‍රල් බොම්බඩියර්— | | | | | | |
| අවිවාහක | 93 00 | 49 60 | — | — | — | 142 60 |
| විවාහක ... | 93 00 | 49 60 | 79 67 | 3 99 | 25 00 | 251 26 |
| සාජන්ට්— | | | | | | |
| අවිවාහක | 147 25 | 49 60 | — | — | — | 196 85 |
| විවාහක ... | 147 25 | 49 60 | 79 67 | 3 99 | 37 50 | 318 01 |
| මාණ්ඩලික සාජන්ට්— | | | | | | |
| අවිවාහක | 170 50 | 49 60 | — | — | — | 220 10 |
| විවාහක ... | 170 50 | 49 60 | 79 67 | 3 99 | 37 50 | 341 26 |
| බලලත් නිලධාරි 2— | | | | | | |
| අවිවාහක | 186 00 | 49 60 | — | — | — | 235 60 |
| විවාහක ... | 186 00 | 49 60 | 79 67 | 3 99 | 40 00 | 359 26 |
| බලලත් නිලධාරි 1— | | | | | | |
| අවිවාහක | 217 00 | 49 60 | — | — | — | 266 60 |
| විවාහක ... | 217 00 | 49 60 | 79 67 | 3 99 | 40 00 | 390 26 |

(ආ) අවිවාහක සොල්දදුවන් හට නිවාසයන්හි වෙසෙන බැවින් ඔවුනට සලාක දීමනා සහ ලොන්ඩරි දීමනා ගෙවනු නොලැබේ.

7. ඉහත සඳහන් 1 වන ඡෙදයෙහි දක්වෙන ඇබෑර්තු සඳහා එවන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් නීතිවලට අනුකූල විය යුතුයි :—

(අ) ඉල්ලුම් පත්‍ර මෙම ගැසට් නිවේදනය අන්තයෙහි දක්වා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍ර පෝරමයේ අනුසාරයෙන් ඉල්ලුම්කරුවන්ගේ අත් අකුරින්ම ලියනලද ඒවා විය යුතුය. මුද්‍රණය කරනලද, ටයිප් ගසනලද හෝ ස්ටීරියෝ ටයිප් කරනලද පෝරම පුරවා එවනු ලබන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

(ආ) ඉල්ලුම් පත්‍ර " යුද්ධ භටයින් බඳවන නිලධාරි ", යුද්ධ හමුදු මූලස්ථානය, තැ.පෙ. අංක 553, කොළඹ, යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයෙහිද, එය බහාලනු ලබන කවරය මතුපිටද, " ඉල්ලුම් පත්‍රය, නිත්‍ය බල සේනා සෙසු නිල පත්වීම් " යන්න සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර 1960 ජූනි මස 7 වෙනි අඟහරුවාදු පස්වරු 4.30 ට පෙර මෙම මූලස්ථානය වෙත ලැබිය යුතුය.

(ඇ) අයදුම්කරුවන් විසින් ඉල්ලා සිටින තනතුර හා ඒකකය සඳහන් කළ යුතුය.

(ඈ) ඉල්ලුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් පමණක් අමුණා එවිය යුතුයි.

(1) උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියාපදිංචිකර නැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශෙෂ සහතිකය.

(2) තමා විසින් ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(3) ඉල්ලුම්කරුවන් විසින් මෑතදී ලබාගන්නාලද, තමාගේ සුදුසුකම්, චරිතය සහ තමා විසින් ඉල්ලා සිටිනු ලබන තනතුර සඳහා පත්කරගනු ලැබීම පිණිස යෝග්‍යතාවය පිළිබඳ සහතික තුනක්, ඉල්ලුම්කරු රක්ෂාවක යෙදී සිටින්නේ නම්, මේ සහතිකවලින් එකක් තමාගේ වර්තමාන ස්වාමියාගෙන් විය යුතුය.

සැලකිය යුතුයි.—මේ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සමග සහතික පත්‍රවල මුල් පිටපත් එවනු ලැබ ඒවා නැතිවුවහොත් ඊට මෙම කාර්‍යාලය වග කියනු නොලැබේ.

(ඉ) රජයේ සේවයේ යෙදී සිටින්නවුන් විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර යථෝක්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන් එවිය යුතුය.

(ඊ) අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් නොමැති නම්, මොනම හේතුවක් නිසාවත් ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

(ඔ) ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

(ඕ) යම්කිසි ඉල්ලුම්කරුවකු, ඔහු විසින් ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔහුගේ වියදමින්ම, සම්මුඛ පරීක්ෂණය සඳහා, නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස නියම කරනු ලැබේ.

(ක) සම්මුඛ පරීක්ෂණයෙන් සහ අනිකුත් අවශ්‍ය පරීක්ෂණයන්ගෙන් පසු යුද්ධ හමුදු තේරීම් මණ්ඩලය මගින් නිත්‍ය භට සේනාවට පත්කර ගැනීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවකුට, ඔහුගේ මේ පිළිබඳ තේරීමත්, යුද්ධ හමුදවට බඳවාගනු ලැබීම සඳහා පැමිණිය යුතු දිනයත් ලියා දන්වනු ලැබේ.

(ග) වයස අවුරුදු 21 ට අඩු අය, තමාගේ දෙමව්පියන්ගේ හෝ භාරකාරයාගේ කමැත්ත, පළමු කොට ලියවිල්ලකින් ලබාගෙන නොමැති නම්, නිත්‍ය භට සේනාවට බඳවා ගනු නොලැබේ.

(ජ) තෝරාගනු ලබන සෑම අයදුම්කරුවෙක්ම, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත්, විශෙෂයෙන් 1956 අංක 3 දරණ රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම සඳහා දනට පණවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතු පණවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව ක්‍රියා කළ යුතුව තිබේ.

(ට) අයදුම්කරුවකු රෙකමදරු කිරීමට කැමති කෙනෙකු වේ නම්, ඔහු විසින් යථෝක්ත අයදුම්කරුට සහතිකයක් දිය යුතුයි. අයදුම්කරුවකුගේ තෝරාගැනීම පිළිබඳව දරණ අයථා ප්‍රයත්නයක් වේ නම්, අයදුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සකු වීමට ඉඩ තිබේ.

(ඩ) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර දනගන්ට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුනි නම් රාජ කාර්‍යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

ඒ. ජේ. ඉසෙඩ්. නවරත්න,
මේජර්,
යුද්ධ හමුදු ආඥපති වෙනුවට.

යුද්ධ හමුදු මූලස්ථානය,
තැ. පෙ. අංක 553,
කොළඹ, 1960 මැයි 21.

**ආදර්ශ ඉල්ලුම් පත්‍ර පෝර්මය**

1. (අ) නම පැහැදිලි අකුරින් :————.
(සම්පූර්ණයෙන්)
(ආ) ලිපිනය :————.
2. ඉතා කිට්ටු තැපැල්/විදුලි පණිවුඩ කාර්‍යාලය :————.
3. ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.
4. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
5. ජාතිය :————.
6. ඉල්ලුම් කරන තනතුර :————.
(එක තනතුරකට එක ඉල්ලුම් පත්‍රය බැගින් ඉදිරිපත් කළ යුතුයි.)
7. කලින් දරණලද යුද්ධ සේවාව පිළිබඳ විස්තර, තනතුරු සහ දින සහිතව :————.
8. මීට ප්‍රථම නාවුක, යුද්ධ හා ස්වේච්ඡා සේවක හමුදාවල දරූ තනතුරු, තත්ත්වය දින ඇතුළුව සම්පූර්ණ විස්තරය :————.
9. යුද්ධ සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී චරිතය :————.
(යුද්ධ සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී ලබාගත් සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
10. දින සහිත සමත්වූ විභාග, විෂයයන් සමග :————.
(පාසැල් සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
11. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූවාට පසු යෙදී සිටින රක්ෂාව :————.
12. වෙනත් සුදුසුකම් ක්‍රීඩා ආදිය :————.
13. උස :————.
14. ගැසට් නිවේදනයේ සඳහන් පරිදි මේ තනතුර සඳහා ඔබ වෙත සුදුසුකම් තිබේද ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර :————.
15. ඉදිරිපත් කරන ලද චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරු :————.
16. ඉල්ලුම්කරු අත්සනින් සහතික කර සිටින ප්‍රකාශය :————.

ඉහත සඳහන් ප්‍රශ්නවලට මා විසින් සපයන ලද පිළිතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බවට මෙයින් සහතික කර සිටිමි.

දිනය :————. අත්සන :————.

---

## සාමාන්‍ය (ආධුනික) සෙබළුන් බඳවාගැනීම

1. නිත්‍ය හට සේනාවේ සාමාන්‍ය (ආධුනික) සෙබළුන් බඳවාගැනීම පිණිස යට දක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ:—

2. **සාමාන්‍ය කොන්දේසි :**

අයදුම්කරුවකු—

(අ) ලාංකිකයකු විය යුතුයි. "ලාංකික" යනුවෙන් අදහස් කරනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසියකු වූ කෙනෙකි.

(ආ) යටත් පිරිසෙයින් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි 5 වන පන්තිය සමත්ව සිටිය යුතුයි.

(ඇ) උස අඩි 5යි, අඟල් 4ට නොඅඩු විය යුතුයි.

(ඈ) 1960 අගෝස්තු මස 31 වෙනි දිනට වයස අවුරුදු 18ට නොඅඩුවද, 22ට නොවැඩිවද සිටිය යුතුයි.

(ඉ) යුද්ධ හමුදා ආඥාපති තුමාගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

(ආ) සහ (ඇ) යන අනුඡෙදයන්හි දක්වෙන අධ්‍යාපනික හා ශාරීරික සුදුසුකම්, අඩුම වශයෙන් ගැනෙන අවශ්‍යතාවන් බව සැලකිය යුතුයි.

3. **සේවා කාලය.** අවුරුදු 12ක සේවය සඳහා බැඳෙන සෙබලෙකු මුල් අවුරුදු 5 නිත්‍ය බල සේනාවේද, ඉතිරි අවුරුදු 7 නිත්‍ය උප සේවා බල හමුදාවේද සේවය කිරීමෙන් පසු අස් කිරීමටද ඉඩ තිබේ. සමහර අවස්ථාවලදී සෙබලෙකුගේ නිත්‍ය බල සේනා සේවය අවුරුදු 12 දක්වා දික් කරගැනීමටත්, අවුරුදු 32 දක්වා කාලයක් එසේ සේවය කිරීමටත් ඉඩ සලසනු ලැබේ.

4. **වැටුප් හා අතිරේක දීමනාදිය.** දැනට යුද්ධ හමුදා නිත්‍ය බල සේනාවේ සෙසු නිල දරණ සෙබළුන් සඳහා ගෙවනු ලබන වැටුප් හා අතිරේක දීමනාදිය පහත සඳහන් වේ.

(අ) යුද්ධ හමුදාවට බැඳීමේදී 31 දිනක මසකට වැටුප් සහ දීමනා—

| | වැටුප | ජීවනාධාර මුදල | සලාක දීමනා | ලොන්ඩරි දීමනා | විවාහ | යුද්ධ පඩිය |
|---|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| සාමාන්‍ය සෙබළ— | | | | | | |
| අවිවාහක | ... 46 50 | ...27 90 | ... — | ... — | ... — | ... 74 40 |
| විවාහක | ... 46 50 | ...27 90 | ...79 67 | ... 3 99 | ...25 0 | ...183 06 |
| ලාන්ස්/කොපරල්— | | | | | | |
| ලාන්ස්/බොම්බඩියර්— | | | | | | |
| අවිවාහක | ... 62 0 | ...43 40 | ... — | ... — | ... — | ...105 40 |
| විවාහක | ... 62 0 | ...43 40 | ...79 67 | ... 3 99 | ...25 0 | ...214 6 |
| කෝපරල්/ | | | | | | |
| බොම්බඩියර්— | | | | | | |
| අවිවාහක | ... 93 0 | ...49 60 | ... — | ... — | ... — | ...142 60 |
| විවාහක | ... 93 0 | ...49 60 | ...79 67 | ... 3 99 | ...25 0 | ...251 26 |
| සාජන්ට්— | | | | | | |
| අවිවාහක | ...147 25 | ...49 60 | ... — | ... — | ... — | ...196 85 |
| විවාහක | ...147 25 | ...49 60 | ...79 67 | ... 3 99 | ...37 50 | ...318 01 |
| මාණ්ඩලික සාජන්ට්— | | | | | | |
| අවිවාහක | ...170 50 | ...49 60 | ... — | ... — | ... — | ...220 10 |
| විවාහක | ...170 50 | ...49 60 | ...79 67 | ... 3 99 | ...37 50 | ...341 26 |
| බලලත් නිළධාරි 2— | | | | | | |
| අවිවාහක | ...186 0 | ...49 60 | ... — | ... — | ... — | ...235 60 |
| විවාහක | ...186 0 | ...49 60 | ...79 67 | ... 3 99 | ...40 0 | ...359 26 |
| බලලත් නිළධාරි 1— | | | | | | |
| අවිවාහක | ...217 0 | ...49 60 | ... — | ... — | ... — | ...266 60 |
| විවාහක | ...217 0 | ...49 60 | ...79 67 | ... 3 99 | ...40 0 | ...390 26 |

(ආ) අවිවාහක සෙබළුන් හට නිවාසයන්හි වෙසෙන බැවින් සලාක දීමනා සහ ලොන්ඩරි දීමනා ගෙවනු නොලැබේ.

5. ඉහත සඳහන් 1 වන ඡෙදයෙහි දක්වෙන ඇබෑර්තු සඳහා එවන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් නීති වලට අනුකූල විය යුතුයි:—

(අ) ඉල්ලුම් කරන පිළිවෙල :—ඉල්ලුම් පත්‍ර, මෙම නිවේදනය අන්තයෙහි දක්වා ඇති නිර්දේශ අයදුම් පත්‍ර පෝර්මයේ අනුසාරයෙන්, අයදුම්කරුගේ අත් අකුරින්ම පිළියෙලකර පුරවන ලද ඒවා විය යුතුය.

(ආ) ඉල්ලුම් පත්‍ර 1960 ජූනි මස 7 වෙනි අඟහරුවාදා පස්වරු 4.30ට පෙර "යුද්ධ හටයින් බඳවන නිලධාරී, යුද්ධ හමුදා මූලස්ථානය, තැ. පෙ. අංක 553, කොළඹ" යන ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුයි.

(ඇ) ඉල්ලුම් පත්‍රය මත සහ එය බහාලනු ලබන කවරය මතද, "ඉල්ලුම් පත්‍රය—ආධුනිකයින් වශයෙන් බැඳීම" යන්න සඳහන් කළ යුතුයි.

(ඇ) ඉල්ලුම් පත්‍රය සමග පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් පමණක් එවිය යුතුයි—

(1) උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියාපදිංචිකර නොමැති අපේක්ෂකයින් සම්බන්ධයෙන් නම් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා විසින් නිකුත්කරන ලද විශේෂ සහතිකය.

(2) අයදුම්කරු විසින් ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(3) අයදුම්කරු මෑතදී ලබාගන්නා ලද තමාගේ චරිත ශුද්ධිය සහ මෙම තනතුර සඳහා යෝග්‍යතාවය පිළිබඳ සහතික තුනක්. අයදුම්කරු රක්ෂාවක යෙදීසිටින්නේ නම් මින් එක සහතිකයක් තමාගේ වර්තමාන ස්වාමියාගෙන් විය යුතුයි.

**සැලකිය යුතුයි.**—මේ සහතික පත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සමග සහතික පත්‍රවල මුල් පිටපත් එවනුලැබ ඒවා නැති වුවහොත්, ඊට මෙම කාර්යාලය වගකියනු නොලැබේ.

(ඉ) රජයේ සේවයේ යෙදීසිටින්නවුන් විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර යථෝක්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන් එවිය යුතුයි.

(ඊ) අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් නොමැති නම් මොනම හේතුවක් නිසාවත් ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

(උ) ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

(ඌ) සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසු යයි තෝරාගනු ලබන අයදුම් කරුවන්, තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා තමාගේ වියදමින්ම පැමිණ පෙනී සිටිය යුතුය. එම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට පැමිණිය යුතු වේලාව, දිනය සහ ස්ථානය, ඔවුන්ට පුද්ගලිකව දන්වනු ලැබේ.

(එ) තේරීම් මණ්ඩලය මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගැනීමට සුදුසු යයි තෝරාගන්නා ලද අයදුම්කරුවන්, වෛද්‍ය පරීක්ෂණය සඳහා තමාගේ වියදමින් කොළඹ පෙනී සිටිය යුතුයි.

(ඒ) තෝරාගනු ලබන අපේක්ෂකයින් යුද්ධ හමුදා නිත්‍ය හට සේනාවේ සාමාන්‍ය (ආධුනික) සෙබළුන් වශයෙන් බඳවාගනු ලබන අතර යුද්ධ හමුදා අභ්‍යාස මධ්‍යස්ථානයේ හෝ අන් තැනෙක පවත්වනු ලබන ආධුනිකයින් පුහුණු කරවන අභ්‍යාස මාලාවක් අනුගමනය කිරීමට සලස්වනු ලැබේ.

(ඔ) වයස අවුරුදු 21ට අඩු අය තමාගේ දෙමව්පියන්ගේ හෝ භාරකාරයාගේ කැමැත්ත පළමුකොට ලියවිල්ලකින් ලබා ගෙන නොමැති නම් නිත්‍ය හට සේනාවට බඳවාගනු නො ලැබේ.

(ඕ) තෝරාගනු ලබන සෑම අයදුම්කරුවෙක්ම ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත්, විශෙෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව ක්‍රියාකළ යුතුව තිබේ.

(ක) අයදුම්කරුවකු රෙකමදාරු කිරීමට කැමති කෙනෙකු වේ නම් ඔහු විසින් යථෝක්ත අයදුම්කරුට සහතිකයක් දිය යුතුයි. අයදුම්කරුවකුගේ තෝරාගැනීම පිළිබඳව දරණ අයථා ප්‍රයත්නයක් වේ නම් ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සකු වීමට ඉඩ තිබේ.

(ග) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බව ඔහු තෝරාගැනීමට පෙර දැනගැනීමට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත් තෝරාගැනීමෙන් පසු අනාවරණය වුනි නම් රාජ කාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

ඒ. ජේ. ඉසෙඩ්. නවරත්න,
මේජර්,
යුද්ධ හමුදා ආඥාපති තුමා වෙනුවට.

යුද්ධ හමුදා මූලස්ථානය,
තැ. පෙ. අංක 553,
කොළඹ. 1960 මැයි 23.

### ආදර්ශ ඉල්ලුම් පත්‍ර ෆෝරමය

1. (අ) නම පැහැදිලි අකුරින් :————.
(සම්පූර්ණ)

(ආ) ලිපිනය :————.

2. ළඟම කිට්ටු තැපැල් /විදුලි පණිවුඩ කාර්යාලය :————.

3. ළඟම කිට්ටු පොලිස් ස්ථානය :————.

4. උපන් ස්ථානය :————.

(අ) ගම්මුලාදෑනි කොට්ඨාශය :————.

(ආ) ළඟම කිට්ටු නගරය :————.

(ඇ) පළාත :————.

5. ජාතිය :————.

6. පියාගේ නම සහ ජාතිය :————.
(ලියාපදිංචිකළ ලාංකිකයෙක් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කළ යුතුයි).

7. මවගේ නම සහ ජාතිය :————.
(කසාද බැඳීමට පෙර)

8. සමත්වූ විභාග, දින සහ විෂයයන් සමග :————.

9. දින සහිත ලබාගත් අධ්‍යාපනය පිළිබඳ වාර්තාවක් සහ ඉගෙනීම ලැබූ පාසැල්වල නම් :————.

10. උපන් දිනය :————, වයස :————.

11. උස :————.

12. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූවාට පසු යෙදී සිටින රක්ෂාව :————.

13. මීට ප්‍රථම නාවුක, යුද්ධ, හා ස්වේච්ඡා සේවක හමුදාවල දැරූ තනතුරු, තත්ත්වය, දින ඇතුළුව සම්පූර්ණ විස්තරය : ————.

14. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා ආදිය) :————.

15. කොළඹ යුද්ධ සේවා ආරෝග්‍ය ශාලාවේ පවත්වන ලද වෛද්‍ය පරීක්ෂණයකින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යුද්ධ නාවුක හෝ ගුවන් හමුදාවලට බඳවාගැනීම ප්‍රතික්ෂේපකර තිබේද :————.

16. ඉදිරිපත් කරන ලද චරිත සහතික ලබගත් අයගේ නම් සහ තනතුරු :————.

17. ඉල්ලුම්කරුගේ අත්සනින් සහතික කර සිටින ප්‍රකාශනය :—

ඉහත සඳහන් ප්‍රශ්න වලට මා විසින් සපයන ලද පිළිතුරු, මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බවට මෙයින් සහතික කර සිටිමි.

අත්සන :————.

දිනය :————.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ශාරීරික අධ්‍යාපන පරීක්ෂක තනතුර

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ශාරීරික අධ්‍යාපන පරීක්ෂක තනතුරක් සඳහා අයදුම් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ පරිපාලක ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 1960 ජූනි මස 25 දින හෝ ඊට පෙර ලැබිය යුතුය.

2. වැටුප. මෙම තනතුරට නියමිත වැටුප් ක්‍රමය රු. 1,980න් පටන් ගෙන, රු. 2,820ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇතිව රු. 120ක වාර්ෂික පඩි වැඩිවීම් 16කින් රු. 3,900 දක්වා වේ.

3. **සේවයට බඳවා ගැනීමේ නියමයන් හා කොන්දේසි.**

(i) තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම් කරු අවුරුදු තුනක ආධුනිකත්වයටද, දැනටමත් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවල සිටින අය වැඩ බැලීමට ද පත් කරනු ඇත.

(ii) අයැදුම්කරු තවදුරටත් සේවයෙහි යෙදීමට නුසුදුසු බව ආධුනික කාල සීමාව ඇතුලත හැඟිගියොත්, දැනටමත් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු නම්, වැඩ බලන කාල සීමාව ඇතුළත හෝ ආධුනික කාල සීමාව ඇතුලත හෝ කාල සීමාව අවසානයේ දී හෝ කලින් දැරූ තනතුරට නැවත පත් කරනු ඇත. ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නෙකු නොවේ නම් සේවය නතර කරනවා ඇත.

(iii) පරීක්ෂකයෙකු ස්ථිර කිරීම සඳහා දෙපාර්තමේන්තුව මගින් පැවැත්වෙන පරීක්ෂණයකදී තමා වැඩ කරන භාෂාවෙන් සමත් විය යුතුය. මෙම පරීක්ෂණය පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේ තත්ත්වය පමණ වනු ඇත. මෙහි ඉහත සඳහන් පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍රවලට සමාන හෝ ඊට ඉහළ තත්ත්වයක් ඇතැයි අධ්‍යාපන අධ්‍යක්ෂ තැනට හැඟෙන තත්ත්වයක් ඇති පරීක්ෂණයකදී වැඩ කරන භාෂාවෙන් සමත්වී සිටින පරීක්ෂකවරුන් ඉහත සඳහන් සුදුසුකමෙන් නිදහස් කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම් :** සෑම අයදුම්කරුවකුම :—

(අ) දැනට රජයේ සේවයෙහි යෙදී නැත් නම්, 1960. 6. 25 දිනට වයස අවුරුදු 23ට නො අඩු හෝ අවුරුදු 40ට නො වැඩි විය යුතුය.

(ආ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් සහතික පත්‍රයක් ලබා ඇති බවට ද,

(ii) අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ශාරීරික අධ්‍යාපන විද්‍යාලයකින් ලත් සහතිකයක් දරන බවට හා එම සහතික පත්‍රය ලැබීමෙන් පසු තෙවසී කාල පරිච්ඡේදයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පළපුරුද්දක් ඇති බවට, හෝ
රජයේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් උපකෘත පාසැලක හෝ අභ්‍යාස විද්‍යාලයක ශාරීරික අධ්‍යාපන උපදේශකයකු වශයෙන් පස් වසක පළපුරුද්දක් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඉ) සිංහල භාෂාවේ මනා දැනීමක් ලබා තිබිය යුතු ය.

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (සං. ල.: බව්තිස්ම සහතික හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ කටයුතු සඳහා දෙන සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහ/හෝ වෘත්තීය සුදුසුකම් දක්වන සහතිකය.

(ඉ) ඉල්ලුම්කරුගේ සුදුසුකම් චරිතය සහ මෙම තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක් (දැනටමත් රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් මෙම අතුරු ඡේදය යටතේ සහතික එවීම අවශ්‍ය නොවේ.)
**සං. ල. :** මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. ඉහත සඳහන් 4 වැනි ඡේදයේ ප්‍රකාර සුදුසුකම් ඇති රජයේ සේවකයන්ගේ ඉල්ලුම් පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

7. ඉල්ලුම් පත්‍ර හෝ මෙම තනතුර සම්බන්ධ වෙන යම් ලියුම් කියුම් ආදියක් පෞද්ගලිකව මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියකුට නොව අධ්‍යාපන අධ්‍යක්ෂ නැනට එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවාවෙහි තනතුරුවලට කරන පත්කිරීම් වලට අදාල පොදු කොන්දේසිවලට සැලකිල්ල යොමු කරවනු ලැබේ.

9. මුද්‍රිත අයැදුම් පත් නො මැත. ආකෘති පත්‍ර පහත පෙනෙන ආදර්ශයෙන් පිටපත් කරගත යුතුය.

10. සියලුම අයැදුම් පත් ලැබුණු බව දන්වා එවනු ඇත. අයැදුම් පත් භාර ගැනීම අවසන් කොට දින තුනක් ඇතුළත එසේ දන්වා එවනු නො ලැබූ අයැදුම්කරුවන් ඒ බව පරිපාලක ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂට වහාම දන්වා එවිය යුතුය. මෙම නියමය නො පිළිපැදීම අයැදුම්කරුවෙකු සැලකිල්ලට භාජනවීමට ඇති අයිතිවාසිකම් නැති වීමට හේතු වනවා ඇත.

එච්. ඇස්. ආර්. ගුණවර්ධන,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

ඊ. බී. කේ. 1624
1960 මැයි මස 23 වැනි දින,
කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

## ආදර්ශ ආකෘති පත්‍රය

**ශාරීරික අධ්‍යාපන පරීක්ෂක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. 1960. 6. 25 දිනට නියම වයස : අවුරුදු :——. මාස :—. දින—.

4. ජාතිය හා ලාංකිකයකු වූ අන්දම :————.

5. පහත දක්වෙන අය උපන් ස්ථාන :—

(අ) අයදුම්කරු :————.

(ආ) ඔහුගේ පියා :————.

(ඉ) ඔහුගේ පිය පාර්ශවයේ මුත්තා :————.

(ඊ) ඔහුගේ පිය පාර්ශවයේ මී මුත්තා :————.

6. (අ) ශාරීරික අධ්‍යාපන පිළිබඳ ලැබූ සහතික පත්‍ර :————.

(ආ) ශාරීරික අධ්‍යාපන පිළිබඳ ලත් ප්‍රායෝගික පළපුරුද්ද : ————.

| පාඨශාලාවේ හෝ ආයතනයේ නම | දැරූ තනතුර | බැඳුණු දිනය | අස්වූ දිනය | කාලසීමාව | | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | අ | මාස | දින | |
| | | | | | | | |
| | | | මුළු සේවය | | | | |

7. පහත සඳහන් භාෂාවන් පිළිබඳ දැනීම :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඉ) ඉංග්‍රීසි :————.

8. ඉගෙනීම ලැබූ පාසැල් හා විද්‍යාල :————.

9. දැනට කරන රැකියාව විස්තර සහිතව :————.

10. දැනට ලබන වාර්ෂික වැටුප, වැටුප් ක්‍රමය හා මීළඟ වැටුප් වැඩි වීමේ දිනය :————.

11. යුද්ධ සේවය ඇත් නම්, කාලය :————.

12. චරිත සහතික දුන් අය (නෑදැයන් නොවේ) ගේ නම් හා තන තුරු (චරිත සහතික තුනක පිටපත්, (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය.) රජයේ සේවයෙහි නියුක්ත වූවන්ගෙන් මෙය අනවශ්‍ය ය :————.

13. වෙනත් තොරතුරු :————.

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම් කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව පත් කිරීම සඳහා තෝරා ගැනීමට කලින් එළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු වීමටත්, පත් කිරීමෙන් පසු එළිදරව් වුවහොත් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමටත් යටත්වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**චිත්‍රකර්ම පරීක්ෂක තනතුර**

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චිත්‍රකර්ම පරීක්ෂක තනතුරක් සඳහා අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් කරනු ලබන ආකෘති පත්‍රයට අනුව එවිය යුතු ඉල්ලුම් පත්‍ර 1960 ජූනි මස 25 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ කොළඹ 2, මලයි වීදියේ, පාලන ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය රු. 1,980න් පටන් ගෙන රු. 120 වාර්ෂික පඩි වැඩිවීම් 16කින් රු. 3,900 දක්වා නගී. රු. 2,820ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

3. **සේවයට බඳවා ගැනීමේ නියමයන් සහ සේවා කොන්දේසි :—**

(I) මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු අවුරුදු තුනක ආධුනිකත්වයට ද, දැනට මත් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නෙකු නම් වැඩ බැලීමට ද පත් කරනු ලබන්නේ ය.

(II) තෝරා ගනු ලැබූ අයදුම්කරු තවදුරටත් සේවයේ යෙදවීමට නුසුදුසු බව හැඟී ගියහොත් දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නෙකු නම් වැඩ බලන කාල සීමාව ඇතුළත හෝ ආධුනික කාලසීමාව ඇතුළත හෝ එම කාලසීමාව අවසානයේදී හෝ කලින් දැරූ තනතුරට නැවත පත් කරනු ඇත. ස්ථිර වූ හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු නොවේ නම් ඔහුගේ සේවය නතර කරනවා ඇත.

(III) තනතුරෙහි ස්ථිරවීමට සුදුසුකම් ලැබීමට ප්‍රථම දැනටමත් දෙමළ භාෂාවෙන් එවැනි හෝ ඊට උසස් සුදුසුකම් ලබා නොමැත්තේ නම් පත් කිරීමේ දින සිට තෙවසක කාල පරිච්ඡේදයක් ඇතුළත දී ඔහු විසින් පොදු අධ්‍යාපන සහතික පත්‍ර පරීක්ෂණයෙන් (සාමාන්‍ය පෙළ) (අ) නිර්දේශ පත්‍රිකාවේ දෙමළ භාෂාව සහ දෙමළ සාහිත්‍යය පරීක්ෂණ පත්‍රවලින් සමර්ථ විය යුතු වේ. මෙම සුදුසුකම ලබා නොමැති නම් තෙවසකින් පසුව පඩි වැඩිවීම් නො ගෙවනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු පිළිබඳව සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඔහු දැනටමත් රජයේ සේවයෙහි යෙදී නැත් නම් 1960 ජූනි මස 25 වැනි දිනට වයස අවුරුදු 23 ට නො අඩු බවට සහ අවුරුදු 40 ට නො වැඩි බවට,

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන වූ හෝ උසස් පරීක්ෂණයකින් සමර්ථ වී සිටින බවට.

(ඉ) යටත් පිරිසෙයින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද චිත්‍රකම් ගුරු සහතික පත්‍රය ලබා ඇති බවට,

(ඊ) යටත් පිරිසෙයින් චිත්‍රකර්මය පිළිබඳ තෙවසක පළපුරුද්දක් ලබා ඇති බවට,

(උ) දෙමළ භාෂාව පිළිබඳ හොඳ දැනීමක් ලබා ඇති බව, හා

(ඌ) යහපත් චරිතයක් හා ශාරීරික සුදුසුකම් පිළිබඳ,

5. අයදුම්කරුවන් විසින් තමන්ගේ ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (සං. ලු.—බවුතීස්ම සහතික හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ කටයුතු සඳහා නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ; සහ

(ඉ) ඉල්ලුම්කරුගේ සුදුසුකම් ; චරිතය, සහ මෙම තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් මෑතදී ලබා ගන්නා ලද සහතික පත්‍ර තුනක් (දැනටමත් රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් මෙම අතුරු ඡේදය යටතේ සහතික පත්‍ර එවීම අවශ්‍ය නොවේ).
**සං. ලු.**—මෙම සහතික පත්‍ර පිටපත් තුන ආපසු එවනු නො ලැබේ.

6. ඉල්ලුම් පත්‍ර හෝ මෙම තනතුර සම්බන්ධ අන් කිසි ලියකියවිලි ආදිය පෞද්ගලිකව මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුට නොව, පාලන ශාඛාවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ නමට එවිය යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ පළකර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසිවලට සැලකිල්ල යොමු කරනු ලැබේ.

8. මුද්‍රිත අයැදුම්පත්‍ර සපයනු නොලැබේ. ආකෘති පත්‍ර පහත පෙනෙන ආදර්ශ ආකෘති පත්‍රයෙන් පිටපත් කරගත යුතුය.

9. සියලුම අයැදුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයැදුම් පත්‍ර භාර ගැනීම අවසන් කොට දින තුනක් ඇතුළත එසේ දන්වා එවනු නොලැබූ අයැදුම්කරුවන් විසින් ඒ බව පරිපාලන ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂතැනට වහාම දන්වා එවිය යුතුය. මෙම නියමය නො පිළිපැදීම අයැදුම්කරුවෙකු ගැන සලකා බැලීම සඳහා ඇති අයිතිවාසිකම් නැතිවීමට හේතු වනවා ඇත.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

අංක : ඒ. බී. කේ. 1558,
1960 මැයි මස 21 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

## ඉහත සඳහන් කරන ලද ආදර්ශ ආකෘති පත්‍රය

### චිත්‍රකම් පරීක්ෂක තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම : (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. 1960 ජූනි මස 25 වැනි දිනට නිවැරදි වයස : අවුරුදු :————. මාස :———. දින :————.
4. ජාතිය හා එය ලද අන්දම :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඔහුගේ පියා :————.
   (ඉ) ඔහුගේ පියාගේ පියා :————.
   (ඊ) ඔහුගේ පියාගේ පියාගේත් පියා :————.
6. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ ඊට සමාන වූ උසස් සහතික පත්‍ර පරීක්ෂණයකින් ඔබ සමත් වී සිටින්නෙහි ද (එසේ නම් එය ලබන ලද්දේ සිංහලෙන් ද/දෙමළෙන් ද/ඉංග්‍රීසියෙන් ද යන වග සඳහන් කරමින් සහතික පත්‍රය නම් කරන්න—සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
7. චිත්‍රකර්මය පිළිබඳව ලබා ඇති සුදුසුකම් (සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
8. දෙමළ භාෂාව පිළිබඳ දැනුම :————.
9. ඉගෙනීම ලැබූපාසැල් හා විද්‍යාල :————.
10. දැනට යෙදී සිටින රක්ෂාව විස්තර සහිතව : (ගුරුවරයෙකු නම් ලියාපදිංචි කළ අංකය, පාඨශාලාවේ නම, දැනට ලැබෙන වාර්ෂික වැටුප, වැටුප් ක්‍රමය හා මීළඟ පඩි වැඩිවීමේ දිනය) :————.
11. චිත්‍රකර්මය ඉගැන්වීමේ පළ පුරුද්ද (මෙහි පහත දක්වෙන ෆෝරමයෙහි විස්තර සඳහන් කරන්න) :————.

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | දරූ තනතුර | ඇතුළත් වූ දිනය | අස් වූ දිනය | සේවා කාලය | | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | අවු. | මා. | දි. | |
| | | | | | | | |
| | | මුළු කාලය ... | | | | | |

12. යුද සේවාවට බැඳී සිටියේ නම් සේවාකාලය (අස්වීමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.) :————.
13. චරිත සහතික ලබා ගත් අයගේ (ඥාතීන් නොවේ.) නම් හා ලිපිනල (සහතික තුනක පිටපත් (මුල් පිටපත් නො වේ) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය.) :————.
14. අනික් විස්තර :————.
15. ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා එයින් නුසුදුසුබවට පැමිණෙනවා පමණක් නොව, තේරීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනහොත්, කිසිම වන්දි ගෙවීමක් රහිතව, මා රාජකාරියෙන් පහ කර දැමීමට යටත්වන බව මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### හස්ත කර්මාන්ත (යාන්ත්‍රික) පරීක්ෂක තනතුරු

මෙහි පහත දක්වෙන 4 වැනි ඡේදයේ සඳහන් වූ කොන්දේසි තෘප්ත කරන අපේක්ෂකයින්ගෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හස්ත කර්මාන්ත (යාන්ත්‍රික) පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ෆෝරමය අනුව ඉල්ලුම් පත් පිළියෙල කොට, කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, පාලන අංශයේ, අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත 1960 ජූනි මස 25 වැනි දින ට කලින් ලැබෙන්ට එවිය යුතු ය.

2. වැටුප.—මෙම තනතුරට අයත් ක්‍රමය වර්ෂයට රු. 1,980 න් පටන්ගෙන රු. 120 වාර්ෂික පඩි වැඩිවීම් 16 කින් රු. 3,900 දක්වා නගී. රු. 2,820 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

**සංලක්ෂ්‍යය.**—මීට ඉහළ වැටුප් ක්‍රමයක් දරන පළමුවැනි පෙළ වෘත්තීය පුහුණු ගුරුවරුන් මෙම තනතුරුවලට පත් කරනු ලැබුවොත් ඔවුන්ට පෞද්ගලික වූ එම වැටුප් ක්‍රමයෙහිම පිහිටුවනු ලැබේ.

3. **සේවයට බඳවා ගැනීමේ නියමයන් හා කොන්දේසි.**—(i) තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරුවන් දැනටමත් රජයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක ස්ථිර කර නැත්නම්, තුන් අවුරුදු සේවා පරීක්ෂණයකට යටත්ව පත් කරනු ලැබේ.

(ii) අයදුම්කරු තවදුරටත් සේවයෙහි යෙදීමට නුසුදුසු බව ආධුනික කාල සීමාව ඇතුළත හැඟීගිය හොත්, දැනටමත් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු නම්, වැඩ බලන කාල සීමාව ඇතුළත හෝ, ආධුනික කාලසීමාව ඇතුළත හෝ, එම කාල සීමාව අවසානයේ කලින් දරූ තනතුරට නැවත පත් කරනු ඇත. ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නෙකු නොවේ නම්, සේවය නතර කරනවා ඇත.

(iii) පරීක්ෂකවරයකු ස්ථිර කිරීම සඳහා දෙපාර්තමේන්තුව මගින් පැවැත්වෙන පරීක්ෂණයකදී තමා වැඩ කරන භාෂාවෙන් සමත්විය යුතුය. මෙම පරීක්ෂණය පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාග තත්ත්වය පමණ වනු ඇත. මෙහි ඉහත සඳහන් පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍රවලට සමාන හෝ ඊට ඉහළ තත්ත්වයක් ඇතැයි අධ්‍යාපන අධ්‍යක්ෂ

තැනට හැගෙන තත්ත්වයක් ඇති පරීක්ෂණයකදී වැඩ කරන භාෂාවෙන් සමත් වී සිටින පරීක්ෂකවරුන් ඉහත සඳහන් සුදුසුකමෙන් නිදහස් කරනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම්—සෑම අයදුම්කරුවකුම :—

(i) දැනට රජයේ සේවයේ යෙදී නැත්නම්, 1960. 6. 25 වැනි දිනට වයස අවුරුදු 23 ට නො අඩු බව සහ අවුරුදු 40 ට නොවැඩි බවට ද,

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන හෝ ඊට ඉහළ විභාගයකින් සමත් වූ බවට ද,

(iii) වෘත්තීය පුහුණු වූ ගුරු සහතික පත්‍රය හෝ හස්ත කර්මාන්ත සහතික පත්‍රය හෝ දරන බවට ද,

(iv) හස්ත කර්මාන්ත ඉගැන්වීමෙහි තුන් අවුරුදු කාලයක පළ පුරුද්දක් ඇති බවටද,

(v) සිංහල/දෙමළ භාෂාවේ මනා දැනුමක් තිබෙන බවටද,

(vi) මනා කල් ක්‍රියාවෙන් හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත වූ බවට ද,

සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

සංලක්ෂ්‍යය.—වෘත්තීය විෂයයන් පිළිබඳව විදේශයන්හි පාඨමාලා හදාරා ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. ඉල්ලුම්කරුවන් විසින් සිය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් වන සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (බව්තීස්ම සහතිකය හෝ උප කෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ කටයුතු සඳහා දෙන සහතික පත්‍ර හෝ පිළිගනු නො ලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා/හෝ වෘත්තීය සහතික පත්‍ර.

(ඉ) ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ මෙම තනතුරට පත්කිරීමට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන්, මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක් (දැනටමත් රජයේ සේවයෙහි යෙදීසිටින අයදුම්කරුවන් මෙම අතුරු ඡේදය යටතේ සහතික එවීම අවශ්‍ය නොවේ.)

සංලක්ෂ්‍යය.—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. ඉහත සඳහන් 4 වැනි ඡේදයේ ප්‍රකාර සුදුසුකම් ඇති රජයේ සේවකයන්ගේ ඉල්ලුම් පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිය ඉල්ලුම් පත්‍ර සිය ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියා මගින් එවිය යුතුය. රජයේ අභ්‍යාස විද්‍යාලයවල හස්ත කර්මාන්ත උපදේශකවරුන් හා රජයේ මධ්‍ය මහා විද්‍යාලයවල, මහා විද්‍යාලයවල හා විද්‍යාලයවල වෘත්තීය පුහුණු ගුරුවරුන් සිය ඉල්ලුම් පත්‍ර විද්‍යාලයාධිපති මගින් එවිය යුතුය. විද්‍යාලයාධිපතීන් විසින් එම ඉල්ලුම් පත්‍ර නියමිත අත්දමට යෙදෙන පරිදි මේ දෙපාර්තමේන්තුවේ ටී. සී. හෝ ජී. ඊ. ශාඛා මගින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැනට ඉදිරිපත් කළ යුතුය.

7. මුද්‍රිත අයදුම් පත් නොමැත. මෙහි පහත පෙනෙන ආදර්ශ ආකෘති පත්‍ර අනුව ඉල්ලුම් පත් පිළියෙල කරගත යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවාවෙහි තනතුරුවලට කරන පත් කිරීම් සඳහා අදාල වන පොදු කොන්දේසි වලට සැලකිල්ල යොමු කරනු ලැබේ.

9. සියලුම අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ඇත. අයදුම් පත් භාර ගැනීම අවසන් කොට දින තුනක් ඇතුලත එසේ දන්වා එවනු නොලැබූ අයදුම්කරුවන් ඒ බව වහාම පරිපාලක ශාඛාවේ අධ්‍යාපන ධ්‍යක්ෂ තැනට දන්වා එවිය යුතුය. මෙම නියමය නොපිළිපැදීම අයදුම්කරුවකු සැලකිල්ලට භාජනවීමට ඇති අයිතිවාසිකම් නැති වීමට හේතු වනවා ඇත.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

ඒ. බී. කේ. 1596.
1960 මැයි මස 23 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### හස්ත කර්මාන්ත (යාන්ත්‍රික) පරීක්ෂකවරුන්ගේ තනතුරු

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. 1960. 6. 25 වැනි දිනට නියම වයස : අවුරුදු :————. මාස :————. දින :————.
4. ජාතිය හා ලාංකිකයකු වූ අත්දම :————.
5. පහත දක්වෙන අය උපන් ස්ථාන :—
   (අ) අයදුම්කරු :————.
   (ආ) ඔහුගේ පියා :————.
   (ඉ) ඔහුගේ පිය පාර්ශවයේ මුත්තා :————.
   (ඊ) ඔහුගේ පිය පාර්ශවයේ මී මුත්තා :————.
6. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :————.
7. ලබා ඇති වෘත්තීය සුදුසුකම් :————.
8. හස්ත කර්මාන්තය ඉගැන්වීමේ පළ පුරුද්ද :————.

| පාඨශාලාවේ හෝ ආයතනයේ නම | දැරූ තනතුර | බැඳුණු දිනය | අස්වූ දිනය | කාල සීමාව | | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | අ. | මා. | දි. | |
| | | | මුළු සේවය | | | | |

9. පහත සඳහන් භාෂාවන් පිළිබඳ දැනීම :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඉ) ඉංග්‍රීසි :————.
10. ඉගෙනීම ලැබූ පාසල් හා විද්‍යාල :————.
11. දැනට ලබන වැටුප, වැටුප් ක්‍රමය හා මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.
12. දැනට කරන රැකියාව පිළිබඳ විස්තර :————.
13. යුද්ධ සේවය ඇත්නම්, ඒ පිළිබඳ විස්තර :————.
14. චරිත සහතික දුන් අය (නෑදෑයන් නොවේ) ගේ නම් හා තනතුරු (චරිත සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය.) රජයේ සේවයේ නියුක්තවූවන්ගෙන් මෙය අනවශ්‍යය :————.
15. වෙනත් තොරතුරු :————.

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව පත් කිරීම සඳහා තෝරා ගැනීමට කලින් එළිදරව් වුවහොත්, මා නුසුදුසු සතු වීමටත්, පත් කිරීමෙන් පසුව එළිදරව් වුවහොත්, කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමටත් යටත්වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ගුවන් විදුලි දෙපාර්තමේන්තුව

### ගුවන් විදුලි වාර්තාකරු තනතුර

ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි වාර්තාකරු තනතුරක් සඳහා මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීම කෙළවර ඇති ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම් පත් 1960 ජූනි 10 වැනි දිනට පළමු ලැබෙන සේ ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් නමට එවිය යුතුයි. ලිපිනය: තැ. පෙ. අංක 574, ලංකා ගුවන් විදුලි ආයතනය, කොළඹ 7. ආකෘති පත්‍ර වෙන ම සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "ගුවන් විදුලි වාර්තාකරු තනතුර" යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුර සඳහා නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 2700—10×120, 6×180—රු. 4,980 කි.

3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—මෙම තනතුර තාවකාලිකය, විශ්‍රාම වැටුප් රහිතය. පළමුවෙන් පත්වීම දෙනු ලබන්නේ තුන් වසක සෝදිසි කාලයකටය.

4. අවශ්‍ය සුදුසුකම්.—(i) සෑම අයදුම්කරුවෙකු ම, යට දැක්වෙන අවශ්‍යතා සතු බව ඔප්පුවන, සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1960 ජූනි 10 වැනි දිනට වයසින් අවුරුදු 21 ට නොඅඩු හා 45 ට නොවැඩි බව,

(ආ) ලන්ඩන් මැට්‍රික්යුලේෂන් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා තරාතිරමක සිංහල හා/හෝ දෙමළ දැනුමක් ද සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක කලා/විද්‍යා පිළිබඳ උපාධි ධරයෙකු නැත හොත් අඩු වශයෙන් ලන්ඩන් විශ්ව විද්‍යාලයයේ කලා/විද්‍යා පිළිබඳ මධ්‍ය පරීක්ෂණයෙන් සමර්ථ වූවකු හෝ ලංකා විශ්ව විද්‍යාලයයේ කලා/විද්‍යා පිළිබඳ ප්‍රථම පරීක්ෂණයෙන් සමර්ථ වූවකු හෝ බව ;

(ඉ) අසාමාන්‍ය සාධු චරිතයකින් හා කායික සුවයකින් යුක්ත වූවකු බව ;

(ii) ලංකාවේ හෝ පිට රටක ප්‍රවෘත්ති පත්‍ර කලාව පිළිබඳව, තුන් වසකට වැඩි අඛණ්ඩ පළපුරුද්දක් ඇති අයගෙන් ද ඉහත දක්වෙන අධ්‍යාපනික සුදුසුකම් නොමැතිවත් ඉල්ලුම් පත් භාර ගනු ලැබේ. ඔවුහු තම ඉල්ලුම් පත් එවන විට එම පළපුරුදු කම් ඔප්පුවන සාක්ෂ්‍ය ද එවිය යුත්තාහ.

(iii) ප්‍රවෘත්ති වාර්තා කිරීම ද මයික්‍රොෆෝනයෙන් දුටු තැන සිට විස්තර සැපයීම හා ව්‍යාඛ්‍යානය කිරීම ද ගුවන් විදුලි වැඩ සටහන් උදෙසා සම්මුඛ විචාරනයන් පැවැත්වීම ද පත්වීම් දෙනු ලබන ඉල්ලුම් කරුවන්ගේ රාජකාර්යයන් වේ.

5. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත් සමඟ යට දක්වෙන ලියකියවිලි (මුල් ලියවිලි නොව) පිටපත් එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතික පත්‍රය. (බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ අවශ්‍යතා සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික භාර ගනු නොලැබේ.)

(ii) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දක්වෙන සහතිකය සහ

(iii) තනතුරු ලැබීමට ඇති යෝග්‍යත්වය සහ ඒ පිළිබඳ නිපුනත්වය ද සුදුසු කම් හා චරිතය ද ගැන මෑතක දී ලබාගත් සහතික දෙකක්. (රජයේ සේවයේ දැනටම යෙදී සිටින ඉල්ලුම්කරුවන් විසින් මෙම උපඡේදය යටතේ ලියවිලි නොඑවුවමනාය.)

**සැළකිය යුතුය :**—මෙම ලියකියවිලි පිටපත් ඉල්ලුම්කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ. මුල් ලියකියවිලි එවිය යුත්තේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිටය.

6. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ නියුක්ත ඉල්ලුම්කරුවන්ගේ අයදුම්පත්, නියමිත දිනට කලින් ඒ ඒ දෙපාතර්මේන්තු ප්‍රධානීන්ට ලැබී ඇත්නම් හා එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ප්‍රමාදයට සෑහෙන හේතු දක්වමින් ඉල්ලුම් පත් පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් මිස, භාර ගනු නොලැබේ.

7. ඉල්ලුම් පත් හා ඒ සම්බන්ධ සියලු ලියවිලි එවිය යුත්තේ ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් නමට මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වන ඡේදයේ මුල පළවන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළ පොදු කොන්දේසි බලනු මනාය.

9. ඉල්ලුම් පත් ලැබුනු වග නොදන්වනු ඇත.

ඩී. ඊ. ගුණරත්න,
ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්.

1960 මැයි 27 දින,
කොළඹ 7,
ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේදී.

## තනතුරු ඉල්ලීමේ ආදර්ශ ආකෘති පත්‍රය

### ගුවන් විදුලි වාර්තාකරු තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

(1) සම්පූර්ණ නම (අච්චු අකුරෙන්) :————.
(අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
(ආ) සෙසු නම් :————.

(2) ස්ථිර ලිපිනය :————.

(3) 1960 ජූනි 10 වැනි දිනට නියම වයස : අවුරුදු........මස........ දින........ (උප්පැන්න සහතිකයේ පිටපත ඇමිණිය යුතුය)

(4) ජාතිය :—

(i) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද පරම්පරාවෙන්ද යන වග :————.

(ii) ලාංකිකත්වය පාරම්පරිකව නම් යට සඳහන් අයගේ උපන් දිනයත් ස්ථානයත් සඳහන් කරන්න :————.
(අ) අයදුම්කරුවාගේ :————.
(ආ) අයදුම්කරුවාගේ පියාගේ :————.
(ඉ) අයදුම්කරුවාගේ (පිය පරපුරෙන්) මුත්තාගේ :————.
(ඊ) අයදුම්කරුවාගේ (පිය පුරපුරෙන්) මුත්තාගේ පියාගේ :————.

5. අධ්‍යාපනික සුදුසුකම් :————.

(6) ප්‍රවෘත්ති පත්‍ර කලා පිළිබඳව ඇති පළපුරුද්ද :————.
(අ) අවුරුදු ගණන :————
(ආ) පළපුරුද්ද විස්තර (කිනම් ලියවිලි සාක්ෂ්‍ය වශයෙන් අමුණා ඇත්ද යන වග) :————.

(7) මීට අමුණා ඇති චරිත සහතික ලබාගත්තේ කවුරුන්ගෙන්ද යන වග හා ඒ අයගේ ලිපිනයන් :————.

(8) යුද සේවය කළ අය උදෙසා ඇති පහසුකම් වලින් ප්‍රයෝජන ගන්නේද යන වග (එසේ නම් යුද සේවයෙන් අස්කිරීමේ සහතික පිටපත් හෝ අනෙක් සාක්ෂ්‍ය ලියවිලි මීට ඇමිණිය යුතුයි) :————

(9) කිසිකලෙක රජයේ සේවයේ නියුක්ත වූයේද යන වග හා එසේවී නම් තැනත්, කාලයත් (ඒ ඒ දෙපාර්තමේන්තුවල සේවය කළ කාලය වෙන් වශයෙන් දක්විය යුතුයි) :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

## ගුවන් විදුලි දෙපාර්තමේන්තුව

### ප්‍රවෘත්ති උප-සංස්කාරක තනතුර

ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති උප-සංස්කාරක තනතුරක් සඳහා මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීමේ පාමුල දක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු අයදුම් පත් 1960 ජූනි 10 වැනි දින නොඉක්මවා ලැබෙන සේ කොළඹ තැ. පෙ. 574, ලංකා ගුවන් විදුලි ආයතනයේ ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් නමට එවිය යුතුයි. ආකෘති පත්‍ර වෙනම සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ " උප-සංස්කාරක " යන්න පැහැදිලි අකුරෙන් ලිවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,820—9×120, 8×180 හා 4×240—රු. 6,300කි.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය ; විශ්‍රාම වැටුප් සහිතය. මුල් වතාවේ තනතුර දෙනු ලබන්නේ තුන් වසක සෝදිසි කාලයකට ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(1) සෑම අයදුම්කරුවෙකු විසින්ම යට සඳහන් කරුණු ස්ඵුට කෙරෙන සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1960 ජූනි 10 වැනි දිනට වයසින් අවුරුදු 21ට නොඅඩු හා 40ට නොවැඩි බව. (දෙපාර්තමේන්තුවේ සේවයේ දැනටම යෙදී සිටින අයදුම්කරුවන් උදෙසා මෙම වයස් සීමා බල පවත්වන්නේ නැත.)

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු හෝ ලංකා විශ්ව විද්‍යාලයයේ කලා/විද්‍යා පිළිබඳ ප්‍රථම පරීක්ෂණයෙන් එසේ නැත්නම්, ලන්ඩන් විශ්ව විද්‍යාලයයේ කලා/විද්‍යා පිළිබඳ මධ්‍ය පරීක්ෂණයෙන් සමත්වූවකු හෝ බව,

(ඇ) පුවත්පත් කලා පිළිබඳ ඉමහත් පළපුරුද්දක් ඇත්තෙකු බව,

(ඈ) මනා චරිතයකින් යුක්තවූවකු බව.

(2) ලංකාවේ හෝ අන් රටක, අඩු වශයෙන් දැවුරුද්දක්වත් පුවත්පත් කලා පළපුරුද්දක් ඇති අයදුම්කරුවන්ගෙන්, ඉහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් නැතිවද, ඉල්ලුම්පත් සළකා බලනු ලැබේ. මෙවැනි අයදුම්කරුවන් විසින් එකී පුවත්පත් කලා පළපුරුදුකම් පිළිබඳ සාක්ෂි ඉල්ලුම් පත්‍රයක් සමග එවිය යුතුය.

(3) කතෘත්වයේ මනා දැනුමක්ද, ලෝකයේ තත්කාලීන සිඞින් පිළිබඳ මනා දැනුමක්ද අයදුම්කරුවන් වෙත තිබිය යුතුය. ලඝු ලේඛනය දැන සිටීම වැඩිපුර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

5. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියකියවිලි පිටපත් අමුණා එවිය යුතුයි :—

(1) උප්පැන්න සහතික පත්‍රය. (බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කළ උප්පැන්න සහතික පත් පිළිගනු නොලැබේ.)

(2) ඉහළම අධ්‍යාපනික සුදුසුකම දක්වෙන සහතිකය සහ,

(3) අයදුම්කරුගේ චරිතය, කාර්ය සූරත්වය සහ තනතුරට පත් කිරීමේ යෝග්‍යත්වය දක්වෙන මෑතකදී ලබාගත් සහතික දෙකක්.

මේ සහතික පිටපත් අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ.

**සැළකිය යුතුයි.**—මුල් සහතික පිටපත් එවිය යුත්තේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිටය.

6. නියමිත දින ඉක්මවා මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත කාල සීමාව තුළදී ලැබී ඇත්නම් හා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයට වළංගු හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් එය පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස, පිළිගනු නොලැබේ.

7. මේ සම්බන්ධයෙන් එවන ඉල්ලුම්පත් හා වෙනත් ලියකියවිලි ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් නමට මිස, මෙම දෙපාර්තමේන්තුවේ අනෙක් නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොඑවිය යුතුය.

8. රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ මුල දක්වෙන පොදු කොන්දේසි බලන්න.

9. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

ඊ. ඊ. ගුණරත්න,
ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්.

1960 මැයි 27 දින,
කොළඹ 7.

## ඉල්ලුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය

### ප්‍රවෘත්ති උප-සංස්කාරක තනතුර

(1) සම්පූර්ණ නම (අච්චු අකුරෙන් ලියන්න) :————.

(2) ස්ථිර ලිපිනය (අච්චු අකුරෙන් ලියන්න) :————.

(3) (අ) 1960 ජූනි 10 වැනි දිනට තියම වයස : අවුරුදු :—— මාස :——, දින :——.

(ආ) උපන් දින (උප්පැන්න සහතික පිටපත ඇමිණිය යුතුයි) :————.

(4) ජාතිය :————.

(i) ලාංකිකත්වය පෙළපතින්ද ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.

(ii) ලාංකිකත්වය පෙළපතින් නම් යට සඳහන් අය උපන් තැන දන්වන්න :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඉ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඊ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

(5) අධ්‍යාපනික සුදුසුකම (සාක්ෂ්‍ය ලෙස ඇමුණු ලියවිලි කවරේද) :————.

(6) පුවත්පත් කලා කටයුතු පිළිබඳ පළපුරුද්ද (අමුණා ඇති ලියවිලි කවරේද) :————.

(7) අමුණා එවන චරිත සහතික ලබාගත් අයගේ නම සහ ලිපින : ————.

(8) සේවාමුක්ත භටයින් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේද යන වග (එසේ නම් සේවාවෙන් අස්වීමේදී ලබාගත් සහතිකය හෝ සමාන සාක්ෂිවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

(9) රජයේ සේවයේ කිසිකලෙක යෙදී සිටියේ නම් ඒ කවදා කොතැනද යන වග (ඒ ඒ දෙපාර්තමේන්තුවල සේවය කළ කාලපරිච්ඡේදයන් සඳහන් කළ යුතුයි) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ බෙදාදී ඇති බිම් කට්ටි ඕවර්සියර් තනතුරු

ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ දෙවන ශ්‍රේණියේ ඉඩම් කට්ටි ඕවර්සියර් තනතුරු 11ක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

**2. වැටුප් ක්‍රමය සහ බඳවා ගැනීමේ කොන්දේසි :**

මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

වැටුප : (අ) II වන ශ්‍රේණිය : වසකට රු. 750—42—1,086 ක් වේ.
I වන ශ්‍රේණිය : වසරකට රු. 1,044—42—1,380ක් වේ.

**3. අයදුම්කරුවන්ට තිබිය යුතු ආධ්‍යාපනික සුදුසුකම් සහ වෙනත් සුදුසුකම් :**

සැම අයදුම් කරුවකුම ලාංකිකයකු විය යුතු අතර වයස අවුරුදු 24 ට නො අඩුවූ ද අවුරුදු 40 ට නො වැඩිවූද අය විය යුතුය.

අයදුම් කරුවන්ට පහත සඳහන් සුදුසුකම් ද තිබිය යුතුයි :—

I (අ) කණිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන සහතිකයක්, සහ

(ආ) ගොවිකම් පාසැලක පුහුණුව ලැබූ බවට සහතිකයක් හෝ ආහාර නිෂ්පාදන ඕවර්සියර් කෙනෙකු වශයෙන් අවුරුදු දෙකක පුරුද්දක් හෝ.

II ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තාවකාලික ඕවර්සියර් කෙනෙකු හැටියට අවුරුදු පහකට නො අඩු සේවයක් ඇති, විෂයයන් වශයෙන් සිංහලය හෝ දෙමළ හෝ ඇතිව ඉංග්‍රීසි 7 වැනි ප්‍රමාණයෙන් සමත් වැඩ සහ හැසිරීම යහපත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තාවකාලික ඕවර්සියර් වරු.

(මෙම දිස්ත්‍රික්කයේ පදිංචි අවශ්‍ය සුදුකම ඇති අයදුම් කරුවන් ගැන පළමු කොට සළකා බලා ඊට පසුව ඉඩම් කොමසාරිස් විසින් විශෙෂයෙන් සඳහන් කරන තදාසන්න දිස්ත්‍රික්කවල පදිංචි අයදුම් කරුවන් ගැන ද සළකා බලනු ලැබේ).

**4. සේවය බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි :**

තෝරා ගනු ලබන අයදුම් කරුවන් සඳහා අවුරුදු තුනක ආධුනික පරීක්ෂණ කාලයක් ඇත.

(අ) තෝරාගත් අයදුම් කරුවන් පත් කිරීමට පෙර රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත් විය යුතුයි.

(ආ) තෝරා ගත් අයදුම් කරුවන්ට බයිසිලයක් වැනි සම්මත කළ වාහනයක් තිබිය යුතුය.

(ඇ) තෝරා ගත් අයදුම් කරුවන් රු. 250 ට නො අඩු ඇපයක් තැබීමට සූදානම් විය යුතුයි.

(ඈ) පත් කරනු ලැබුවන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසද විශෙෂයෙන් ම 1956 අංක 33 දරණ රජයේ භාෂා ප්‍රතිපත්තියේ විධි විධාන ක්‍රියා යෙදවීම පිණිසද දැනට පණවා ඇති හෝ මින් මතුවට පණවනු ලබන හෝ ඕනෑම ව්‍යවස්ථාවකට අනුකූලව ක්‍රියා කළ යුතුයි.

5. අයදුම් කරුවන් චරිතය සම්බන්ධයෙන් මෑතකදී ලබා ගන්නා ලද සහතික පත් දෙකක පිටපත් ඉල්ලුම් පතට අමුනා එවිය යුතුයි.

6. නියමිත කර ඇති ආකෘති පත්‍රය ප්‍රකාර අයදුම් පත් සකස් කොට 1960 ජූනි මස 11 වෙනි දිනට හෝ ඊට පෙර අනුරාධපුර දිසාපති තැනට යැවිය යුතුයි. ආකෘති පත්‍රයට අනුකූල නොවන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

7. අයදුම් පත් ලැබුණු බැව් දන්වා එවනු නො ලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වෙනි ඡේදයේ පළවූ රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි මෙම තනතුරු කෙරේද බලපානු ලබේ.

ඇන්. පී. විජයරත්න,
අනුරාධපුර දිසාපති.

1960 මැයි මස 5 වෙනි දින,
අනුරාධපුර දිසාපති කායීාලයයේ දී ය.

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ බෙදා දී ඇති බිම් කට්ටි ඕවර්සියර් තනතුරු සඳහා අයදුම් ආකෘති පත්‍රය

(1) සම්පූර්ණ නම :————.

(අ) අගට යෙදෙන නම :————.

(ආ) වෙනත් නම් :————.

(2) ලිපිනය :————.

(3) ජාතිය :————.

(4) උපන් දිනය : * සහ ස්ථානය :————.

(අ) ඉල්ලුම් කරුගේ :————.

(උප්පැන්න සහතිකයේ පිටපතක් අයදුම් පතට අමුනා එවිය යුතු)

(ආ) ඉල්ලුම් කරුගේ පියාගේ :————.

(ඉ) ඉල්ලුම් කරුගේ පිය පාර්ශවයේ මුත්තාගේ :————.

(ඊ) ඉල්ලුම් කරුගේ පියා පාර්ශවයේ මී මුත්තාගේ :————.

(5) අධ්‍යාපනික සුදුසුකම් :————.

(සහතිකවල පිටපත් අයදුම් පතට අමුනා එවිය යුතුයි)

(6) ගොවිකම් සහ ශාස්ත්‍රීය සුදුසුකම් :————.

(සහතිකවල පිටපත් අයදුම් පතට අමුනා එවිය යුතුයි)

(7) අයදුම් කරුට ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ බෙදා දුන් රජයේ බිම් කට්ටියක් තිබේද ? එවැනි ඉඩමක් තිබේ නම් :————.

(අ) එය පිහිටා ඇති ව්‍යාපාරයේ නම :————.

(ආ) බෙදා දී ඇති ප්‍රමාණය :————.

(ඉ) බෙදා දුන් දිනය :————.

(8) වෙනත් සුදුසුකම් :————.

මේ අයදුම් පත්‍රයෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බවත් මා උසාවියක වරදකරුවකු නොවී ඇති බවත් මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත් වීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍ය තාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතුවන බව හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

අයදුම් කරුගේ අත්සන.

දිනය :

* අයදුම් කරු ලංකාවේ උපන්නේ නම් (අ) හැර (ආ) හෝ (ආ) සහ (ඊ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම් කරු ලංකාවේ ඉපදී නොමැති නම් (අ) හැර (ආ) සහ (ඉ) යන දෙකින් එකක් පිරවිය යුතුයි.

| නම | ලිපිනය |
| --- | --- |
| සිවඥානසුන්දරම්, ඒ. කේ. | ඒ. කරුණාපතිපිල්ලේ බාරේ, පුලෝප්පලේ නැගෙනහිර, පල්ලේසි |
| සිවඥානම්, වී. ආර්. ... | උප තැපැල් කාර්යාලය, මල්ලාකම් |
| සිවඥානසුන්දරම්, ජී. ... | සර්කියුලර් රෝඩ්, කරෙයිනගාර් |
| සිවනන්දරාජා, ඇන්. ... | උප තැපැල් ස්ථානාධිපති භාරේ නයිනාතිව් |
| සිවනාදන්, ඇන්. ... | "මුතුමාලිකේ", කෝපායි උතුර, කෝපායි |
| සිවපාතසුන්දරම්, ඒ. කේ. | සිවානි හන්දිය, සන්දිලිපෙ |
| සිවපාතසුන්දරම්, ඇස්. | අත්තායි, පූනකරි |
| සිවපාතසුන්දරම්, සී. ... | මීසාලේ උතුර, මීසාලේ |
| සිවපාදම්, ඇස්. ... | තැ. පෙ. අංක 918, කොළඹ |
| සිවපාලසිංහම්, ආර්. ... | පල්ලිය පාර, චන්කානෝ |
| සිවපිරගාසම්, වී. ... | කල්වායල්, චාවකච්චේරි |
| සිවපිරගාසම්, ඇස්. ... | වඩ්ඩළුඩයාර් හවුස්, කර්වානේ උතුර, වල්වෙට්ටිතුරේ |
| සිවලිංගම්, ඇම්. ... | තම්බචෙට්ටි, පූලෝලි බටහිර, පොයින්ට් පේද්‍රුරු |
| සීමන්, සී. ... | කළු/බොන්දුපිටිය, තල්ගස්ගොඩ, මීගම |
| සුගතදාස, කේ. ඒ. ... | බටකැත්තර, මඩපාත |
| සුදර්සනරාජා, කේ. ... | අම්මාන් කෝවිල් වීදිය, වල්වෙට්ටිතුරේ |
| සුන්දරවේල්, ඇස්. ... | එද්දෙක් කාඩු, අච්චුවේලි |
| සුබ්‍රමනියම්, කේ ... | තැපැල් කන්තෝරු සේවිංස් බැංකුව, කොළඹ |
| සුබ්‍රමනියම්, කේ. ... | පෙරියමනල්, කාරෙයිනගාර් |
| සුබ්‍රමනියම්, පී. ... | කයිතඩි බටහිර, කයිතඩි |
| සුමනදාස, ඩබ්ලිව්. බී. ... | දුනුකේවල, හිරිවඩුන්න, කෑගල්ල |
| සුමනදාස, ටී. ... | මුල්ලේගම, හෝමාගම |
| සුමනසිරි, ඇල්. ඒ. වී. | තැපැල් කන්තෝරු සේවිංස් බැංකුව, කොළඹ |
| සුරේන්තිරන්, ඇස්. ... | පාලකඩු, කරෙයිනගාර් |
| සුසෙයිපිල්ලේ, ඇෆ්. ... | තැපැල් කාර්යාලය, යාපනය |
| සුහේඩ්, ඇම්. ඇස්. ඇම්. | අංක 217, කහටපිටිය, ගම්පොල |
| සෙනෙවිරත්න, ඒ. ඇස්. ඩබ්ලිව්. එච්. ටී. බී. | ප්‍රාදේශීය තැපැල් අධිකාරි (මධ්‍යම) කාර්යාලය, මහනුවර |
| සෙනෙවිරත්න, ඇල්. බී. | තැපැල් සහ විදුලි සංදේශ වැඩපළ, කොළඹ 10 |
| සෙනෙවිරත්න, එච්. සී. | "අගනෝ", කොරස, උඩුගම්පළ |
| සෙල්ලතුරේ, කේ. ... | කාවලකඩ්ඩුවේ, කොල්ලන් කලඩි, තෙල්ලිපලේ |
| සෙල්වනාදන්, ඒ. පී. | වෙලානේ බටහිර, බංගලාවාඩිය, වෙලානේ |
| සෙල්වනායගම්, ඇස්. ... | වවුනියා නිරිතදිග වි. සේ. ස. ස., සුදු රෙන්තපුලම්, වවුනියා |
| සෙල්වරත්නම්, වී. ... | තන්ගෝඩෙයි, කාරෙයිනගර් |
| සෙල්වරත්නම්, ඊ. ජේ. | සිල්ලාලේ, පන්ඩතෙරුප්පු |
| සෙල්වරාසා, ඒ. ... | පී. අරුමෙතුරේ භාරේ, සුදුමලේ උතුර, මානිපායි |
| සෙල්වවිනායගමූර්ති, පී. | අලවෙඩ්ඩි |
| සේනාධීර, ඇන්. ඇස්. | ගල්ඔලුව, වැලිවේරිය |
| සේනානායක, කේ. ඇස්. යූ. | තැපැල් කාර්යාලය, හිඟුරක්ගොඩ |
| සේනාරත්න, පී. සී. ... | මුරුත්තෙට්ටුව, දෙහිඹිවිට |
| සේනානායක, ඩබ්ලිව්. පී. ජී. බී. | මද්දෙගෙදර, කටුගහහේන |
| සේරසිංහ, ඇස්. ඇම්. බී. ඇල්. | තැපැල් කාර්යාලය, මහනුවර |
| සෝමසිරි, කේ. ... | කිරලවැල්ල, රූප්පෙවත්ත, දෙවිනුවර |
| සොක්කනාදන්, කේ. | "පොන්නාකම්", මල්ලාකම් |
| සොයිසා, ආර්. ඇම්. ... | පාර්සල් කාර්යාලය, ප්‍රධාන තැපැල් කාර්යාලය, කොළඹ |
| සෝමනායක, ජී. ඊ. ද ඇස්. | මැතෝදිස්ත පාසැල, මාලිම්බඩ, පාලතුව |
| සෝමපාල, ඒ. ඇම්. ... | උප තැපැල් කාර්යාලය, පොතුවටවන, කොස්වත්ත |
| සෝමරත්න, ඇම්. ඩබ්ලිව්. | ස්වයංක්‍රිය හුවමාරු ස්ථානය, ගාල්ල |
| සෝමසුන්දරම්, පී. ඇස්. | පලේයඩි, පුත්තලේ, පොයින්ට්පේද්‍රුරු |
| ශ්‍රීලිංගම්, වී. ... | අංක 15/1, නල්ලූර් උතුර, යාපනය |
| ෂන්මුගම්, කේ. ... | තැපැල් කාර්යාලය, මහනුවර |
| ෂන්මුගරාජා, ඇස්. ... | අංක 140, ජේප්ර්බිස් පාර, කොළඹ 10 |
| ෂන්මුගලිංගම්, ආර්. ... | වෙට්ටියාර් මඩම්, අරාලි උතුර, වඩ්ඩු කොඩ්ඩේ |
| ෂෙල්ටන්, කේ. ජී. ... | තලවතුහේන්පිට උතුර, මහර, කඩවත |
| ශ්‍රියාරත්න, බී. එච්. ජී. | ඉඳුරුවේගොඩ, පයියාගල |
| හන්ති, පී. ... | උඩුපිලගෙවත්ත, කඹුරුපිටිය |
| හර්බට්, පී. ජී. ඒ. ... | මාතරගමවත්ත, අකුරැස්ස |
| හරිඩ්, ඇස්. ඇම්. ... | උප තැපැල් කාර්යාලය, හක්ගල, නුවරඑළිය |
| හෙට්ටිආරච්චි, ජී. ... | 68, පන්සල පාර, වේරගම්පිටිය, මාතර |
| හේරත්, පී. එච්. ඇම්. පී. බී. | උප තැපැල් කාර්යාලය, මීතලාව |

(2) ඉහත සඳහන් අපේක්ෂකයන්ට පත්වීම් වහාම දීමට ආණ්ඩුව බැඳී නැත. නමුත් ඇබෑර්තු ඇතිවූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සියළුම පත්වීම් දෙනු ලබන්නේ අවුරුදු 3 ක ආධුනික කාල සීමාවකට සහ එම සේවය පිළිබඳ කොන්දේසිවලට යටත්වය.

(3) අපේක්ෂකයන්ට මව්සින් ලියා දන්වනු ලැබේ.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ, 1960 මැයි මස 21 වන දින දිය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), පත්‍ර කඩදාසි සැපයීම සඳහා 1960 ජූනි 14 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ජූනි 13 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 මැයි 27 වැනි දින,
කොළඹදීය.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### අයි. සී. ඒ. ටෙන්ඩර් දැන්වීමයි

1960 අප්‍රේල් 8 වැනි දින අංක 12,102 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් ලංකා විශ්ව විද්‍යාලයට ලෝහ ජනේල සැපයීම සඳහා වූ අංක අයි. සී. ඒ—270 දරණ ටෙණ්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය පසුව දැනුම් දෙන තුරු තාවකාලිකව අවලංගු කරණ ලද බව කරුණාවෙන් සලකන්න.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 මැයි 23 වෙනි දින,
කොළඹ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් හසලක ඉදිකෙරෙන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ස්ථිර නිවාස (ගොඩනැගිලි අංක 48) සහ අධි ස්ථිර ගබඩා ගොඩනැගිල්ල සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 25,000ට සහ රු. 10,000ට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 ජූනි මස 22 වෙනි බදාදා පෙරවරු 10 වන තෙක් සීල් තබනලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. වේරගන්තොට හසලක වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකුත් කරනු ලබන ටැන්ඩර් පත්‍රිකා පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුවන අතර, සැලසුම් හා සියළුම විස්තර ඔහුගේ කාර්යාලයෙන් ලබාගත හැක.

3. එක ටැන්ඩරයකට රුපියල් 25 බැගින් හසලක වාරිමාර්ග උප කොට්ඨාශ කාර්යාලයේ හෝ මහනුවර කච්චේරියේ මුදල් තැන්පත් කොට ලබාගත් රිසිට් පතක් සමඟ සුදුසුකම් ඔප්පු කළ අයට පමණක් 1960 මැයි මස 30 වැනි සඳුදා සිට 1960 ජූනි මස 20 වෙනි සඳුදා වනතෙක් ටැන්ඩර් පත්‍රිකා දෙනු ලැබේ.

ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නො ලැබුනහොත් ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට යට කී දිනයේ යට කී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන ගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකලහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත් වූ දින සිට සති තුනක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුය.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන වෙත තබා ගනු ලැබේ.

11. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

12. කොන්ත්‍රාත් කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

13. 1934 රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥා පණත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. වැඩ ගැනීමට නුසුදුසුයයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

15. වැඩ පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

16. වැඩි විස්තර කුණ්ඩසාලේ, කෘෂිකර්ම උප කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

17. තෝරා පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත දී මුදල් ගෙවා එම උපකරණ ගෙනගොස් අවසන් කළ යුතුයි.

ඒ. වී. රිචඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 මැයි මස 16 දා,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වාරියපොළ ගොවිපොළේ පොල් විකිණීම

කුරුණෑගල, මල්ලවපිටියේ කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන විසින් වාරියපොළ ගොවිපලෙහි ඇති පොල් 15,000ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1960 ජූනි 10 වෙනි දින පස්වරු 2.30 වන තුරු භාරගනු ලැබේ.

2. කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන ගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, මල්ලවපිටිය, කුරුණෑගල" යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "වාරියපොල ගොවිපලේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතු යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක්ද සහිතව සීල් තබන ලද කවරය තුළ බහා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර්පත්‍ර බහාලන ලද කවරයේ "වාරියපොල ගොවිපලෙහි පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර්පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් දින දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත්කර ගත යුතුයි. එසේ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර්පත්‍රයක් ටෙන්ඩර්පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබාගනී.

9. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

10. 1934රේ 19 වෙනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව තබා ගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 ජූනි මස 21 වැනි කුජද උදේ 10 වන තෙක් භාරගනු ලැබේ.

1. හොරන රෝහලේ සාත්තු සේවිකා නිවාසයනට වැසිකිලි සහ සේවකයන්ට නාන කාමර තැනීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960. 6. 10 වැනි සිකුරාද සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 5,000 වඩා වටිනාකමැති ගොඩනැගිලි කර්මාන්තයන් සඳහා රජයේ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම්කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කාර්‍යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡෙදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පූරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එමැනුවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1960 ඔක්තෝබර් 1 වන ද සිට 1961 සැප්තැම්බර් 30 වනද දක්වා (දින දෙකම ඇතුලත්ව) කාලය තුළ, මේ සමග ඇති උප ලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන්වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ ගාලු මුවදොර මහ ලේකම් කාර්‍යාලය යා බද '' බී '' අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන විසින් භාරගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතු යි.

සැ.යු.—කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝරම මෙම කාර්‍යාලයෙන් ලබාගත හැක.

(11) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකළපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නො වන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතු යි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත වේලාසනින් එවිය යුතු යි.

3. **වත් කමේ විස්තර.**— මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නො දරණ අය ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීට හෝ දන්විය යුතු යි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දනගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩරපත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ, '' බී '' අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහ ලේකම් කාර්යාලය, ගාලු මුවදොර, කොළඹ, කියා එවිය යුතු යි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතු මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කවරයෙහි බහන ලද ටෙන්ඩරපත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්තු) දීමෙන් ඒ ලැබු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම් හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරික්ෂා කළ හැකි ය.

8. **ටෙන්ඩර්යන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ '' බී '' උප ලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුව ය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි '' සී '' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන්ද සඳහන් කළ යුතු යි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතින එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමු වන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේනම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නාලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතු ය.

11. **බඩු බාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩ කඩ සලසාදෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේ ය.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අංශය, මහලේකම් කාර්‍යාලය,
ගාලු මුවදොර, කොළඹ. 23.5.60.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර භාරගන්නා අවසාන දිනය සහ වේලාව | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයන්ට: මාළු | සේවකයන්ට: මස් | සේවකයන්ට: කරවල | සේවකයන්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: මාළු | නොගෙවන රෝගීන්ට: මස් | නොගෙවන රෝගීන්ට: කරවල | නොගෙවන රෝගීන්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: කිරි (ආහාර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නුවර කොට්ඨාශය—** | | | | | | | | | | | | |
| අකුරන ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 400 | | 300 | 300 | 300 | 1,150 | 700 | 650 | 650 | 2,700 | — |
| අඹගහ පැලැස්ස මාතෘනිවාසය | 100 | 200 | | 100 | 100 | 100 | 500 | 150 | 150 | 200 | 600 | — |
| අංකුඹුර ආරෝග්‍යශාලාව | 100 | 600 | | 500 | 450 | 500 | 1,850 | 800 | 750 | 800 | 3,200 | — |
| බඹරදෙනිය මාතෘනිවාසය | 100 | 400 | | 250 | 250 | 300 | 1,150 | 100 | 100 | 150 | 550 | — |
| බටුමුල්ල මාතෘනිවාසය | 100 | 300 | | — | — | 1,250 | 950 | — | — | 450 | 350 | — |
| දෙල්තොට ආරෝග්‍යශාලාව | 100 | 1,000 | | 400 | 450 | 450 | 1,750 | 1,400 | 1,500 | 1,450 | 5,750 | 50 |
| දෙළොස්බාගෙ ආරෝග්‍යශාලාව | 100 | 800 | | 350 | 200 | 500 | 1,450 | 1,400 | 400 | 3,000 | 5,500 | — |
| දුන්හින මාතෘනිවාසය | 100 | 200 | | — | 300 | 800 | 750 | — | 250 | 750 | 750 | — |
| එරමුදුලියැද්ද මාතෘනිවාසය | 100 | 400 | | 200 | 200 | 200 | 850 | 250 | 250 | 300 | 1,000 | — |
| ගලගෙදර ග්‍රාමීය රෝහල සහ මාතෘනිවාසය | 100 | 800 | | 400 | 400 | 400 | 1,600 | 1,150 | 1,150 | 1,150 | 4,600 | — |
| ගල්පිහිල්ල මාතෘනිවාසය | 100 | 400 | | 150 | 150 | 150 | 650 | 150 | 100 | 150 | 450 | — |
